# The SIGNALL

18

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016









Sri Lanka Signal Corps - 2016





1987 වර්ෂයේ කතරගම පැවති පිරික්සුම් පහන් සංදර්ශණය සඳහා සහභාගී වූ සංඥා බලකා කණ්ඩායම



1987 වර්ෂයේ කතරගම පිරික්සුම් පහන් සංදර්ශණය සඳහා ස්වයංක්‍රීයව ධාවනය වන මෝටර් රථයක් ඉදිරිපත් කිරීම



1981 අන්තර් රෙජිමේන්තු "බී" කාණ්ඩයේ හොකී තරඟාවලියේ ශූරතාවය දිනාගත් සංඥා බලකා කණ්ඩායම



1981 අන්තර් රෙජිමේන්තු හොකී තරඟාවලියේ ශූරතාවය දිනාගත් සංඥා බලකා කණ්ඩායම





# ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය

වර්ෂ 1943 ඔක්තෝම්බර් මස 19 දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා සංඥා බලකාය යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් ක්‍රියාන්විත රාජකාරී කාර්යය භාරයන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සන්නිවේදන සේවාවක් පවත්වා ගැනීම මූලික කරගෙන 2007.03.12 වන දින යුද්ධ හමුදා චර්යා නියෝග 44/2007 මගින් පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුලදී ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය ස්ථාපනය කරන ලදී.

ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය එහි ආරම්භයේ සිට ත්‍රස්තවාදයට එරෙහි මානුෂීය මෙහෙයුමෙහි සාර්ථක නිමාව දක්වා වූ තීරණාත්මක කාලය තුල යුද හමුදාවේද අනෙකුත් සේවාවලද පොලිසියටද සිවිල් ආරක්ෂක සේවාවටද අවශ්‍ය පරිදි සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය හා විද්‍යුත් සංග්‍රාමික විෂයන්හි අනුශාසකත්වය, සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම හා නඩත්තු යන ක්‍රියාවලියන්හි නිරතවෙමින් විශිෂ්ඨ කාර්‍යභාරයක් ඉටුකරන ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව හා ඊට සම්බන්ධ සිවිල් ආයතන සමගින්ද මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ක්‍රියාකරන ලදී. වත්මන් ප්‍රධාන සංඥා නිළධාරී වශයෙන් මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරමින් සිටී.

මෙසේ ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියනා ශ්‍රී ලංකා සංඥා බලකාය වඩාත් කාර්‍යක්ෂම හා වෘත්තිමයම යුධ බලකායක් ලෙස යුද්ධ හමුදාවේ මෙන්ම ජාතික අවශ්‍යතාවයන්හි නිරන්තරයෙන් නිරතව සිටින අතර, එහිදී ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය එම කටයුතු සියල්ල පිළිබද විශේෂ දැක්මකින් යුතුව ඊට අදාල තාක්ෂණික ඥාණය හා ඉදිරි කටයුතු සම්පාදනයෙහිලා කැපවී ක්‍රියා කරනු ලබයි.

එමෙන්ම තාක්ෂණික දැනුම හා කාර්‍යක්ෂමතාවය තව දුරටත් වැඩි දියුණු කරමින් යුද්ධ හමුදා මූලස්ථානයේ අනුමැතිය මත 12 වන සංඥා බලකාය 2015.07.10 දින සයිබර් ආරක්ෂක ඒකකය (Cyber Security Unit) වශයෙන් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. එම ඒකකයේ අභිවෘද්ධිය සඳහා ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් හා පූර්ණ අධීක්ෂණය යටතේ ඉදිරි කටයුතු සිදුකරමින් පවතින අතර එම ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් කර්නල් එස්පීපී පක්ෂවීර ජ්‍යෙෂ්ඨ නිලධාරී පත්කර ඇත. එම ඒකකය මගින් තොරතුරු තාක්ෂණය හා අනුබද්ධිත සියළු කටයුතුවල ආරක්ෂාව අරමුණු කරගනිමින් පරිගණක, ජාල පද්ධතීන්, මෘදුකාංග සහ දත්තයන්හට හිතාමතා හෝ නොදැනුවත්ව අනවසරයෙන් පුද්ගලයින් මගින් සිදුවිය හැකි අනවසර ඇතුල්වීම්, වෙනස් කිරීම් හෝ විනාශ කිරීම් මගින් ආරක්ෂාවීම සබැඳිව කටයුතු කරනු ලබයි.

තවද යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන් සපුරාලීම වස් ආධාරක බලඇණියක් වශයෙන් රාජකාරී කල 6 වන ශ්‍රී ලංකා සංඥා බලකාය තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් 2014.06.16 දින ස්ථාපිත කර ආසේමු(යා) බල ප්‍රදේශයේ සියළුම තොරතුරු තාක්ෂණ රාජකාරීන් සාර්ථකව මේ වන විට කටයුතු කරගෙන යනු ලබයි.

ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ ස්ථාපිත එස් ඛණ්ඩය තාවකාලිකව ප්‍රසංනි මූලස්ථාන ගොඩනැගිල්ල තුල ස්ථානගතව තිබූ අතර, ප්‍රධාන සංඥා නිලධාරී තුමාගේ උපදෙස් හා පූර්ණ අධීක්ෂණය යටතේ නව ගොඩනැගිලක් ඉදිකර "එස්" ඛණ්ඩය කාර්‍යාලය සහ සියළුම උපකරණ ගබඩාවන් 2016.08.10 දින නව ගොඩනැගිල්ලේ මේ වන විට ස්ථානගත කර ඇති අතර, දැනට එම ගොඩනැගිල්ලේ ඉදිරි වැඩ කටයුතු නිමවෙමින් පවතී.





ඒ සමගම යුද හමුදා සාමාජිකයින්ගේ පවුල්වල දූදරුවන්ගේ පරිගණක දැනුම වෘත්තිය පුහුණු මට්ටමින් ලබාදීම පිණිස ආරම්භ කර ඇති රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන මේ වනවිට පනාගොඩ, අනුරාධපුරය, මහනුවර යන නගරවල ස්ථාපිතව ඇති අතර, කුරුවිට හා කොකාවිල් ස්ථානවල පිහිටුවා ඇති පුහුණු ආයතනය මගින් යුද හමුදාවේ සේවය කරන සාමාජික සාමාජිකාවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම පිණිස පාඨමාලාවන් අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි. මේ අනුව තොරතුරු තාක්ෂණය පිළිබඳව දැනුම ලබා ගැනීම සඳහා මෙම ආයතන වෙත මේ වන විට විශාල සිසු සිසුවියන් ප්‍රමාණයක් දිනපතා පැමිණෙයි. තවද මෙම ආයතනයන්හි පාඨමාලා හදාරනු ලබන සිසුන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුවීම් අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ වෘත්තීය පරීක්ෂණයන්ට පෙනී සිටීමේ අවස්ථාවද උදාකරදී ඇත. ලිපිකරු පාඨමාලාව හදාරා නිමයන ලිපිකරුවන් /ලිපිකාරිනියන් උදෙසා පූර්ණ කාලීන මසක පුහුණු පාඨමාලාවන් කුරුවිට හා කොකාවිල් වල පිහිටි රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන මගින් පවත්වනු ලබයි.



නවතමයෙන් ඉදිකෙරෙමින් පවතින එස් ඛණ්ඩ ගොඩනැගිල්ල



ලුතිනන් කර්නල් එම්ආර්එම්ආර්එල්බී වීගස්තැන්න යූඑස්පී නිලධාරී විසින් 2016.04.02 දින ප්‍රසංනිමු ප්‍රමානි 1 (සංඥා) තනතුරෙහි වැඩ භාරගත් අවස්ථාව.



ලුතිනන් කර්නල් පීපීආර් මාදූගොඩ යූඑස්පී නිලධාරී විසින් 2016.07.07 දින ප්‍රසංනිමු ප්‍රමානි 1 (විද්සංඹ) තනතුරෙහි වැඩ භාරගත් අවස්ථාව.

සැකසුම
මේජර් එච්පීජේවී පෙරේරා ආර්එස්පී ශ්‍රීලංසංබ

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටු කරනු ලබන අතර එය 2010 මාර්තු 01 වන දින ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමාගේ මඟ පෙන්වීම හා ඉල්ලීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල සියළුම යුද්ධ හමුදා ආයතන සඳහා වූ මෘදුකාංග විසඳුම් සහ ජාල විසඳුම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නිර්මානය කිරීම සහ නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂක මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. ඉතාමත් සංකිර්ණ වූ ගෘහස්ථ තොරතුරු තාක්ෂණ විසඳුම් නිපදවීමට පහසුකම් සැලසීම සඳහා තොරතුරු තාක්ෂණ සංවර්ධන මධ්‍යස්ථානය ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය සහ දත්ත මධ්‍යස්ථානය සහ පර්යේෂණ හා නිපදවීම් මධ්‍යස්ථානයද, වර්ථමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක තුමාගේ අධීක්ෂණය යටතේ ගොඩනගා ඇත. ඊට අමතරව තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය තුළින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට ලබා දෙන සේවාවල ආරක්ෂාව සහතික කරනු වස් 2015 ජුනි මස සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානය (12 ශ්‍රීලංකා සංඥා බලකාය පිහිටුවන තෙක්) පිහිටුවන ලදී.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය දෙවන ලුතිතන්, ලුතිතන්, කපිතන් සහ වෙනත් නිළයනට බදවා ගන්නා ලද විශේෂාංග දැනුම සහිත මෘදුකාංග ඉංජිනේරු වරුන්, සහකාර මෘදුකාංග ඉංජිනේරුවරුන්, ජාලකරණ ඉංජිනේරුවරුන් සහකාර ජාලකරණ ඉංජිනේරුවරුන්, තොරතුරු තාක්ෂණ ආරක්ෂක විශ්ලේෂකයන්, මෘදුකාංග තත්ත්ව පරීක්ෂක ඉංජිනේරුවරුන්, දෘඩාංග ඉංජිනේරුවන්, සහකාර දෘඩාංග ඉංජිනේරුවන්, තොරතුරු තාක්ෂණ නිලධාරීන්, සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ඉහළ මූලස්ථාන වලින් එන තොරතුරු තාක්ෂණ අවශ්‍යතා කාර්යක්ෂම ව ඉටු කිරීම සදහා එම නිළධාරීන්ගේ විශේෂාංග දැනුම නොඅඩුව ලබා ගැනීම සදහා ඔවුන් ධෛර්යමත් කිරීම ප්‍රධාන සංඥා නිලධාරී මධ්‍යස්ථානයෙහි සහය ද ඇතිව, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

වර්තමානයෙහි එවැනි තොරතුරු තාක්ෂණ නිලධාරීන් 92 ක් ද පරිගණක ක්‍රියාකරුවන් 1037 දෙනෙකුද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය සදහා වූ විවිධ ව්‍යාපෘති සහ එවා සම්බන්ධ විවිධවූ තොරතුරු තාක්ෂණ රාජකාරීන් වල නිරතව සිටි. එම සියළුම ව්‍යාපෘතීන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලයෙහි තොරතුරු තාක්ෂණ විශේෂඥයින්ගේ නිබද අධීක්ෂණය යටතේ සිදුවෙයි. මීට අමතරව 2014 ජුනි මස 16 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල තොරතුරු තාක්ෂණ සම්බන්ධ කටයුතු ඉටු කිරීම උදෙසා 6 වන සංඥා රෙජිමේන්තුව පිහිටුවන ලදී.



සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම



ගිනිඅවි ආදර්ශක ආකෘති ව්‍යාපෘතිය (weapon simulator innovation) අත්හදා බැලීම



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

ව්‍යාපෘතීන්

(අ.) නිමකරන ලද මෘදුකාංග ව්‍යාපෘති
(1) Army Central HR Management System – System Enhancements.
(2) Suwasahana Insurance Management - System Enhancements.
(3) Patient Information Management System (PIMS) – Commissioned in Panagoda and Anuradhapura military hospitals.
(4) Personnel Administration System for Rehabilitation Centres.
(5) Physical Test Monitoring System.
(6) Daily Mail Dispatch Service – System Enhancements.
(7) Army Disciplinary Case Record System.
(8) Task Management System.
(9) Sri Lanka Army Official Website ( www.Army.lk).

(ආ). සංවර්ධනය කරමින් පවතින ව්‍යාපෘති
(1) Strategic Database for Independent Directorate (IndepDte) Phase III.
(2) Officers Career Development Management System.
(3) Non Commissioned Officers Career Development Management System.
(4) Integrated Intelligence and Information Management System Phase III.
(5) Student Information Management System for Senehasa Education Resource Research and Information Centre (SERRIC).
(6) e-Procurement Management System.
(7) Accounts Auditing System for Logistic Command (Log Comd).
(8) Bill Settlement System Phase II.
(9) Daily Mail Dispatch Service – System Enhancements.
(10) Army Central HR Management System – System Enhancements.
(11) P & R Project.
(12) Secure Army ID Card System.
(13) RHQ Benevolent Fund Management System

(ඇ). පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති

වර්තමානයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තාක්ෂණිකව සංකීර්ණ වූ පද්ධති මිලදී ගැනීම හරහා තාක්ෂණිකව සම්පූර්ණ යුද්ධ හමුදාවක් බවට පරිවර්තනය වීමට පිඹුරුපත් සකසා ඇත. ඔවුන් විසින් දක්වන ලද කැපවීමට කරන දිරි ගැන්වීමක් ලෙස ගිනිඅවි ආදර්ශක ආකෘති ව්‍යාපෘතිය (weapon simulator innovation) ඉතා සාර්ථක ලෙස තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිම කල අතර එය Talent Soft 2015 හා Infotel 2015 ප්‍රදර්ශන වල දී ඉතා සාර්ථක ලෙස ප්‍රදර්ශනය කරන ලදී.

සැකසුම
මේජර් පීඑආර් ඇන්තනිස් ශ්‍රීලංසංබ

## සංඥා බලසේනා මූලස්ථානය

සාමය උදාවීමත් සමඟින් රජය විසින් රටතුල ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයේ කොටස් කරුවන් වශයෙන් වර්තමානයේ මෙන්ම අනාගතයේදි ද අප බලසේනා මූලස්ථානය පැවරෙන සංඥා රාජකාරීන් උපරීම අයුරින් ඉටු කිරීමට බැදී සිටින්නෙමු.



සංඥා බලසේනාධිපති තුමාගේ 2 ශ්‍රීලංසංබ (සෙවි) සංචාරය

කුරිරු ත්‍රස්තවාදය ලක් දෙරණින් තුරන්කල පසු වර්ෂයක් පාසා පවත්වනු ලබන "දියකාවා" යුධ අභ්‍යාසය 06 වන වරටත් විදේශිය හමුදාවන්ගෙ සහභාගිත්වයෙන් යුතුව ඒකාබද්ධ යුධ අභ්‍යාසයක් ලෙස සාර්ථකව නිම කර ගැනීම සඳහා අවැසි සංඥා සම්බන්ධතාවයන් මෙම මූලස්ථාන අධීක්ෂණය යටතේ ලබා දෙන ලදි.

අන්තර් සංඥා ඒකක පැසිපන්දු තරඟාවලිය සංඥා රෙජිමේන්තු පැසිපන්දු ක්‍රිඩාංගණයේදි 2016.05.24 දින හා 2016.05.26 වන දිනයන් හී මෙම බලසේනා මූලස්ථාන අධීක්ෂණය යටතේ ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි.

පුරා දින 4 ක් සීගිරියේදි පැවැති යොවුන් පුරය තාරුණ්‍ය වැඩසටහන සඳහා මෙම බලසේනා මූලස්ථාන අධීක්ෂණය යටතේ සංඥා සම්බන්ධතාවය ලබාදුන් අතර. එහි කුඩා පිරික්සුම් පහන් සංදර්ශණය සඳහා සංඥා රෙජිමේන්තුවට අයත් ධාවන පැදි කණ්ඩායම ඇතුලත්වීම හා ප්‍රථම වරට කාන්තා සෙබලියන් කුඩා පිරික්සුම් පහන් සංදර්ශණයෙහි ධාවන සංදර්ශණය ඉදිරිපත් කිරීම විශේෂ අවස්ථාවකි.



සාම සාධක රාජකාරි සදහා රැගෙන යාමට නියමිත සංඥා උපකරණ එක්සත් ජාතීන්ගේ නියෝජිතයින් විසින් පරීක්ෂාවට ලක්කිරීම.

යුධ හමුදාපති තුමන්ගෙ උපදෙස් පරිදි ආධාරක බලඇණිය ලෙසින් පැවති සංඥා ඒකක සඳහා වෘත්තීය බලඇණි පුහුණු පාඨමාලාවක් සංඥා බලසේනා මූලස්ථානයේදී අධීක්ෂණය යටතේ සංඥා පුහුණු පාසල වෙතින් පැවැත්වීමට කටයුතු සිදුකළ අතර. මේ වනවිට 5 වන සංඥා රෙජිමේන්තුවත් 6 වන සංඥා රෙජිමේන්තුවත් පිළිවෙලින් එම පාඨමාලාවන් සාර්ථකව හදාරා නිම කරන ලදී.



2016 අන්තර් සංඥා ඒකක පැසිපන්දු තරඟාවලිය සංඥා බලසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ පැවැත්වීම

**සැකසුම**
**මේජර් එම්එඑස්එස් මුතුගොඩ ශ්‍රීලංසංබ**





## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය

73 වසරක ප්‍රෞඩ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය වේගයෙන් දියුණු වන ලෝකයේ නව සන්නිවේදන හා තාක්ෂණයත් සමග උරෙන් උර ගැටී ඉදිරියටම යමින් පවතින මොහොතක රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පහත සදහන් වෙනස්කම් සිදුවන ලදි.

වර්ෂ 2016 ජුනි 17 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මානි 1 (භකාස) තනතුරේ රාජකාරී කල ලුතිනන් කර්නල් පීපීආර් මාදුගොඩ යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී එම තනතුර අත්හරින ලද අතර. 2016 ජුනි මස 17 වන දින ලුතිතන් කර්නල් පීඑච්එන් චන්ද්‍රසේකර ජ්‍යෙෂ්ඨ නිළධාරී එම තනතුරේ වැඩ භාරගන්නා ලදි. 2016 ජුනි මස 25 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මාණ්ඩලික නිලධාරී 1 (පාලන) තනතුරේ රාජකාරී කල ලුතිනන් කර්නල් පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී එම තනතුර අත්හරින ලදී. එතැන් සිට මේජර් එඑටී සෝමරත්න ජ්‍යෙෂ්ඨ නිළධාරී වැඩ බලන මාණ්ඩලික නිළධාරී 1 (පාලන) තනතුර හොබවන ලද අතර, 2016 අගෝස්තු මස 22 වන දින දින ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක ජ්‍යෙෂ්ඨ නිළධාරී එම තනතුර භාරගන්නා ලදි. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ විධායක අධිකාරී ලෙස කටයුතු කල මේජර් ඩබ්එර්එස් කරුණාරත්න 2016 ජුලි 08 වන දින එම තනතුර අත්හරින ලද අතර, මේජර් කේඑම්අයිපි හේමපාල පීඑස්සී 2016 ජුලි මස 08 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන විධායක අධිකාරී තනතුර භාරගන්නා ලදි.



2016 ජුලි මස 08 වන දින මේජර් කේඑම්අයිපි හේමපාල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සුභ මොහොතින් රෙජිමේන්තු මධ්‍යස්ථාන විධායක අධිකාරි තනතුරේ වැඩ භාරගත් මොහොත.

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් තනතුරේ කටයුතු කල සෙ/275704 බනි 1 කේඑ වානේවත්ත 2016 ජුලි මස 15 වන දින විශ්‍රාම ගැනිම සඳහා එම ධුරය අත්හරින ලද අතර. සෙ/277985 බනි 1 කේඑම් විජේසිංහ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් තනතුර 2016 ජුලි මස 15 වන දින භාරගන්නා ලදි. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන සරඹ උපදේශක ලෙස කටයුතු කල සෙ/277377 බනි 11 ජයකොඩි ජේඑපි 2016 ජුලි මස 02 වන දින එම තනතුර අත්හරින ලද අතර. සෙ/277154 මා/සැ ජයවර්ධන එසිඅයි 2016 ජුලි මස 02 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ප්‍රධාන සරඹ උපදේශක තනතුර භාරගන්නා ලදි. රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධන ලිපිකරු තනතුරේ කටයුතු කල සෙ/276461 බනි 1 එම්පිජේ පෙරේරා 2016 ජුනි මස 17 වන දින එම තනතුර අත්හරින ලද අතර. සෙ/276902 බනි 1 ටිපිඑස් ප්‍රියජනක සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රධාන ලිපිකරු තනතුර 2016 ජුනි මස 17 වන දින භාරගෙන ඇත.

2016 වසර විශේෂ අවස්ථාවන් වශයෙන් පහත සඳහන් කටයුතු සඳහන් කල හැකිය. යුද්ධ හමුදා නිළධාරි වාර්ෂික මැරතන් තරඟාවලිය සඳහා සංඥා බලකා ක්‍රීඩා කණ්ඩායම නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරී/නිලධාරීන් 20 දෙනෙකු සහභාගි වු අතර. එම තරඟාවලියේ තෙවන ස්ථානය හිමිකර ගැනිම හා එම තරඟාවලියේ ලුතිතන් කර්නල් නිළයෙන් ඉහල නිලධාරීන් සඳහා වන තරඟයේ ශූරතාවයද හිමි කර ගන්නා ලදි.

පාලන පරීක්ෂණය වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත පැමිණි යුද හමුදා මාණ්ඩලික ප්‍රධානි වන මේජර් ජෙනරාල් එම්පි පීරිස් ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට සංඥා බලකා සම්මාන මුරයක් පිරිනැමීම, මේජර් ජෙනරාල් බීඑච්එම්එ විජේසිංහ යූඑස්පී එන්ඩියු පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරී මේජර් ජෙනරාල් නිලයට උසස් වීම හේතුවෙන් සංඥා බලකා සම්මාන මුරයක් පිරිනැමීම, සංඥා බලකාධිපති හා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙ ප්‍රධානත්වයෙන් සංඥා බලකා ගීතය එලිදැක්වීම සංඥා බලකාධිපති හා ඉන්දිය සංඥා නිළධාරීන් අතර පැවැති සුහද හමුව, අන්තර් රෙජිමේන්තු මාරුවීම් මත 2(සෙවි) ශ්‍රීලයුපොදුසේබ කාන්තා සෙබලියන් හට සංඥා ලාංජන පැළඳවීම ඒ අතර වන විශේෂ සිදුවීම් වේ.

වර්ෂ 2016 අගෝස්තු මස 19 වන දිනය සංඥා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී නිලධාරී පුහුණු දිනය පැවැත්වූ අතර ඒ සඳහා නිලධාරීන් 155 දෙනෙකු සහභාගි වන ලදි.

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි අභිනවයෙන් ඉදිකල පන්සලෙහි බෝධි රෝපණය සිදුකිරීම සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යුඑස්පි එන්ඩියු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සුරතින් සිදුකරන ලද අතර, සංඥා බලසේනාධිපති වශයෙන් රාජකාරී කල බ්‍රිගේඩියර් එච්පි සෙනෙවිරත්න යුඑස්පි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් නව මුරහල විවෘත කිරීම සිදුකරන ලදි.

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය ඉදිරිපිට පුරන් කුඹුරු අස්වැද්දවීමේ ව්‍යාපෘතියක් 2015 වසර ආරම්භ කර එහි අස්වනු 2016 වසර ලබා ගැනිම හා සෙබලුන් වෙත පැනනැගුණු ගැටළුවක් වන ජල ගැටළුව මේ වන විට සාර්ථකව නිම කිරීමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි.









සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි අභිනවයෙන් ඉදිකල පන්සලෙහි බෝධි රෝපණය සිදුකිරීම හා විශේෂ අවස්ථාවන්

සැකසුම
මේජර් කේඑම්අයිපි හේමපාල පීඑස්සී ශ්‍රීලංසංබ





## 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වසර 72 ක අභිමානවත් ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් කියයි. දෙවන ලෝක යුද්ධය තීව්‍ර වීමත් සමඟම බ්‍රිතාන්‍ය හමුදාවේ අවශ්‍යතා විවිධ අංශයන්ගෙන් වර්ධනය වූ අතර, එහිදී විවිධ අංශයන්ගෙන් පුහුණුව ලත් යුද්ධ භටයින්ගේ අවශ්‍යතාවය තදින්ම දැනෙන්නට විය. මේ හේතුවෙන් 1939 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ බ්‍රිතාන්‍ය රාජකිය හමුදාවේ ක්‍රියාන්විත අවශ්‍යතා සැපයීම පිණිස සහ මිත්‍ර පාර්ශික හමුදාවන්ගේ සංඥා සම්බන්ධතා අවශ්‍යතා සැපයීම සඳහා සංඥා බලඝණ සක්‍රිය සේවයට කැඳවන ලදී. මෙම සංඥා බලඝණය රාජකීය හමුදාවේ ඉංජිනේරු බලකායට අනුයුක්තව රාජකාරීන් සිදු කළ අතර, පසුව රාජකීය හමුදාවේ අවශ්‍යතාවයන් මත 1943 ඔක්තෝබර් මස 19 වන දින අංක 9183 ගැසට් පත්‍රය මඟින් 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය "සිලෝන් සංඥා බලකාය" නමින් පිහිටුවන ලදි. ඉන් අනතුරුව රටේ විවිධ ක්‍රියාන්විත/ක්‍රියාන්විත නොවන අවශ්‍යතාවයන් සඳහා සංඥා සම්බන්ධතා ලබා දීමට 1 වන සංඥා රෙජිමේන්තුව ක්‍රියාකළ අතර, පනාගොඩ/මඩකලපුව/මින්නේරිය/වැලිඔය සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයන්හි ස්ථානගතව සිට මානුෂිය මෙහෙයුමෙන් අනතුරුව වර්මානයේ මුලතිව් දිස්ත්‍රික්කයේ වට්ටප්පලෙයි ප්‍රදේශයෙහි ස්ථානගතව ඇති අතර, ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) සහ ඒ යටතේ ඇති සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, ඒකක මෙන්ම අනෙකුත් යුද හමුදා මූලස්ථාන/අනුඛණ්ඩ සඳහා සංඥා සම්බන්ධතා ලබා දෙමින් රාජකාරී කටයුතු සිදු කරගෙන යනු ලබයි.

ශ්‍රී ලංකා සංඥා බලකායේ වර්ථමාන බලකාධිපති ලෙස රාජකාරී ඇරඹූ මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යුඑස්පි එන්ඩියු පිඑස්පි යුඑස්එසිපිඑස්සි යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ මෙම ඒකක සංචාරය 2015.09.26 දිනට යෙදුනු අතර, ඒ වෙනුවෙන් වැඩසටහන් මාලාවක් මෙම ඒකකය වෙතින් සංවිධානය කරන්නට යෙදුනි.



ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යුඑස්පි එන්ඩියු පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ 2015.09.26 දින ඒකක සංචාරය.

ඒකක භූමියේ නවතමයෙන් ඉදි කරන ලද ස්වයං අධ්‍යයන පියස, ඒකක බුදු මැදුර තුල ඉදි කරන ලද මකර තොරණ, නවතමයෙන් ඉදි කරන ලද සෙබුනිල භට නිවාසය සහ නවීකරණය කරන ලද මුරහල බලකාධිපති තුමන්ගේ සුරතින් විවෘත කිරීම එහිදී මුල්තැනක් ගැනුණු අතර, බලකාධිපති තුමාගේ සහභාගිත්වයෙන් පැවති සියලු නිල සුහද හමුව ඉතා වැදගත් අවස්ථාවක් විය.

එවකට අණදෙන නිලධාරී ලෙස කටයුතු කල ලුතිතන් කර්නල් සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමාගේ සංකල්පයකට අනුව සෙබලෙකුගේ සංඥා දැනුම පිළිබඳ අධ්‍යාපනය මෙන්ම සිය කුසලතා උද්දීපනය කිරීමේ තේමාව පෙරටු කොට ගනිමින් ඒකක භූමියේ ඉදිවූ ස්වයං අධ්‍යයන පියස සංඥා බලකාය තුල නව වෙනසක් ඇති කරන්නට සමත්විය.

එය සංඥා බලකාධිපති තුමන්ගේ මෙම කදවුරු සංචාරය තුලදී විශේෂ පැසසුමට සහ ඇගයීමට ලක්වීම 1 ශ්‍රීලංසංබ ඒකකය වෙත අභිමානයක් එක් කිරීමට සමත් විය. සංඥා සම්බන්ධතා රාජකාරී වල නිරතව සිටින නිලධාරී/ සෙසුනිලයින් හට සංඥා රාජකාරී පිළිබදව සංස්කරණ පාඨමාලාවක් හැදෑරීමට ස්වයං අධ්‍යයන පියස තුල පහසුකම් සලසා ඇති අතර, මෙම ඒකකය වෙතින් සිදු කරනු ලබන විශේෂ පාබල ක්‍රියාන්විත පාඨමාලාවන්ට හා වෙනත් ඒකක පාඨමාලාවන්ටද එය නැවුම් අත්දැකීමක් වී ඇත.

පළවන ජාතික ගෘහස්ථ ඔරු පැදිමේ තරඟාවලියේ සැහැල්ලු බර මීටර 2000 ඉසව්වෙන් දෙවන ස්ථානය ද, සැහැල්ලු බර මීටර 500x4x4. ඉසව්වෙන් ප්‍රථම ස්ථානයද, 26-29 වයස් කාණ්ඩය යටතේ මීටර 500x4x4 ඉසව්වෙන් දෙවන ස්ථානය ද, හිමිකර ගෙන ඇත. ඊට අමතරව ඔහු විසින් 30 වන ජාතික ඔරු පැදිමේ තරඟා වලියේ විවෘත අංශයේ වයස අවුරුදු 18න් ඉහළ සමස්ථ ශූරතාවය ද ලබා ගැනීමට දායක වී ඇත. 2016 වර්ෂයේදී පවත්වන ලද ආරක්ෂක සේවා එලලේ තරඟාවලියේ යුද්ධ හමුදා කණ්ඩායමට ශූරතාවය හිමි වු අතර, ඒ සඳහා මෙම ඒකකයට අයත් සෙ/278629 සෙ-ප්‍රල් ප්‍රියලාල් කේඑස් යන කොනොනි දායක වී ඇත. යුද්ධ හමුදා බී කණ්ඩයේ රගර් තරඟාවලියේ 2016 වර්ෂයේ ශූරතාවය සෙ/284483 සංසෙ කහටපිටිය කේකේඑස්ටී යන සෙනියා ලබාගෙන ඇත.

අවසන් වශයෙන් 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය තුල සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල අභිමානවත් ඒකකයක් ලෙස වැජඹීම සඳහා කැපවීමෙන් රාජකාරී ඉටු කරමින් උරදුන් සියලුම නිලධාරීන් සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් හට ඒකකයේ සියලුම නිලයින්ගේ කෘතඥතාවය පුදකර සිටින අතර ඒකකයේ රාජකාරී කරමින් සිටියදී මියගිය, අතුරුදහන් වු සහ ආබාධිත තත්වයට පත් වු මෙන්ම දැනට විශ්‍රාම ගොස් සිටින සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් ඉතා කෘතඥතාපුර්වකව මේ මොහොතේදි සිහිපත් කරන්නෙමු.



2015 වර්ෂයේ සංඥා ඒකක අතුරින් විශිෂ්ඨතම සංඥා ඒකකය ලෙස 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය පිදුම් ලැබූ අවස්ථාව



ඒකකය තුල නවතමයෙන් ඉදි කරන ලද, ස්වයං පුහුණු පියස, 2015.09.26 දින සංඥා බලකාධිපතිතුමා විසින් විවෘත කරන ලද අවස්ථාව



නවතමයෙන් ඉදිකරන ලද ස්වයං අධ්‍යයන පියස තුල පුහුණුවීම් සිදුකරන අවස්ථා



2016.02.05 දින ඒකක දෙවන අණදෙන නිලධාරි ලෙස මේජර් එම්ඩීඑස් මුතුගල ජ්‍යෙෂ්ඨ නිලධාරි වැඩ භාරගත් මොහොත

සැකසුම
මේජර් එම්එඩීඑස් මුතුගල ශ්‍රීලංසංබ



## 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ව්‍යාප්තියට සමගාමීව සංඥා රෙජිමේන්තුවේ ද ව්‍යාප්තිය පුළුල් කිරීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1989 වර්ෂයේ මාර්තු මස 09 දින බිහි වු 3 වන සංඥා රෙජිමේන්තුව තුල ප්‍රෞඩ ඉතිහාසයක් නිර්මාණය කරමින් අභිමානවත් 27 වන වසරට පා තබා සිටී.

මෙම ඒකකය 21 සේනාංකය යටතේ අනුරාධපුර රණසේවාපුර ස්ථානගතව රාජකාරීන්හි නිරතව සිට 2007 සැප්තැම්බර් මස 18 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශය වෙත පැමිණ වසර 09 කට ආසන්න කාලයක් ගත වී ඇති අතර, ආසේමු (යාපනය) මෙහින් පාලනය වන සේනාංක හා බලසේනාවන්හි සංඥා සම්බන්ධතා ගොඩනැගීමේ කාර්යයට දායකත් වයක් දක්වමින් ඉතා උසස් මට්ටමින් ඒකකයේ ගෞරවය, කීර්තිනාමය ගොඩනගා ගෙන ඇත.

තවද මෙම ඒකක 25 වන අණදෙන නිලධාරී වශයෙන් ලුතිතන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2015.09.19 දින සුභ මොහොතින් අණදෙන නිලධාරී තනතුරේ වැඩ භාර ගත් අතර වත්මන් අණදෙන නිලධාරී වශයෙන් දැනට ඒකකයේ රාජකාරී ඉටු කරනු ලබයි.

බලකාධිපති තුමන්ගේ උපදෙස්අනුවසංඥාදැනුමවර්ධනය කිරීමේ අරමුණින් ආසේමු (යාපනය) බල ප්‍රදේශයේ ඇති ඒකකයන්හි පුහුණුවීම් කටයුතු සඳහා ඒකකයේ සියලු නිලධාරීන් හා සෙසුනිල දායකත්වයෙන් යුතුව "ස්වයං පුහුණු පියස" නිර්මාණය කොට 2016.01.01 දින සේවයට දායාද කරන ලදී.

එමෙන්ම ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බලප්‍රදේශය තුල ස්ථානගත ඒකකයන්හි සංඥා රාජකාරීන් හි නිරතවීමට හැකි සෙබළුන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් මෙම වසර තුල පාබල බණ්ඩ පුහුණු පාඨමාලා වන්හි සංඥා අඩියරයන් 05 ක් පැවැත්වීමට ද කටයුතු කර ඇත.

තවද රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ උපදෙස් මත දැනට ඒකකයේ රාජකාරී නියුතු හා මිය ගිය/ආබාධිත නිලධාරීන් සහ සෙසු නිලයින් හට පවුලේ සාමාජිකයින් සමඟ යාපනය බලප්‍රදේශයේ විනෝද චාරිකා වක් සංවිධානය කිරීම සහ ඒකකය වෙත ගෙන්වා සුහදත්වය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

ඒකකයේ 27 වන සංවත්සර යට සමගාමීව අණදෙන නිලධාරීගේ සහභාගිත්වයෙන් යුතුව ඒකකයේ පවත්වන ලද අන්තර් බලඝණ ක්‍රිකට්, අත්පන්දු, පාපන්දු සහ එල්ලේ තරඟාවලියක් සංවිධානය කොට ක්‍රිඩා හැකියාවන් ඔප් නැං-වීම හා සාමුහිකව වැඩ කිරීම තුලින් ජයග්‍රහණය ලබා ගත හැකි බව ඒකකයේ සියලු නිලයන් හට ඒත්තු ගැන්වීමට කටයුතු කරන ලදී.



ඒකක 27 වන සංවත්සරය උදෙසා අණදෙන නිලධාරි වෙනුවෙන් පිරිනමන සම්මාන මුරය සහ පෙළපාලියේ විශේෂ අවස්ථා.

27 වන සංවත්සරයට සමගාමීව බෝධිපුජා පිංකමක්, සියලු නිලධාරී සහ සෙසුනිලයින්ගේ සහභාගිත්වයෙන් නාග විහාර බෝමැඩ අභියස දී පවත්වන ලදී. ඊට සාපේක්ෂව නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් ද සියලුම නිලයින් වෙනුවෙන් ඒකක ක්‍රිඩා පිටියේ දි උත්කර්ෂවත අන්දමින් සංගීත රාත්‍රියක් ද පැවැත්විය.

2016 වෙසක් කලාපය වෙනුවෙන් අලංකාරවත් වෙසක් පහන් කූඩුවක් නිර්මාණය කරමින් සංඥා බලකායේ සංඥා රාජකාරීන් පමණක් නොව නිර්මාණශිලි කලාකරුවන් ද සිටින බවට ප්‍රදර්ශනය කරමින් මෙම ඒකකයේ නිර්මාණශීලි හැකියාව මනාව ප්‍රදර්ශනය කරන ලදි.

සංඥා බලකායේ සිටින දක්ෂ ක්‍රීඩකයින් තෝරා ඔවුන් අන්තර් රෙජිමේන්තු ක්‍රීඩා තරඟ සඳහා යොමු කිරීම පිණිස 2016 වර්ෂයේ මෙම ඒකකය වෙතින් සංවිධානය කරන ලද අන්තර් සංඥා ඒකක වෙරළ වොලිබෝල් තරඟාවලිය සංඥා බලකායේ සියලු ඒකකයන්ගේ සහභාගිත්වයෙන් මයිලඩි වෙරළ තීරයේදී 2016.06.26 සහ 27 යන දෙදින තුල පැවැත්වීමට කටයුතු කරන ලදි.

අවසන් වශයෙන් 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය යුධ හමුදාව තුල හා සංඥා බලකාය තුල දිනෙන් දින දියුණුවට පවත්වේවායි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.



27 වන සංවත්සරයට සමගාමීව පැවැත්වූ බෝධි පූජා පිංකම් මාලාව.



ඒකක 27 වන සංවත්සරය වෙනුවෙන් පැවැති සංගීත රාත්‍රියේ විශේෂ අවස්ථා.



බලකාධිපති තුමන් සුරතින් ඒකක නිලධාරි නිවස්නයේ නව භෝජනාගාරය විවෘත කිරීම



බලකාධිපති තුමන්ගේ ඒකක සංචාරයේ විශේෂ අවස්ථා

සැකසුම
කපිතන් එච්සීආර්ආර්පීකේ රත්නායක ශ්‍රීලංසංබ





## 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙසින් විරුදාවලි ලත් ශ්‍රී ලංකා මැණියන් ආරක්ෂා කිරීමෙහි භාරදූර වගකීම දරාගෙන දිවිහිමියෙන් ක්‍රියාකරනු ලබන යුද්ධ හමුදා පවුලේ ප්‍රධාන සාමාජිකයෙකු වශයෙන් ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන අභිමානය අතැතිව සංනිවේදනයේ ප්‍රමුඛයා වන ශ්‍රී ලංකා සංඥා බලකායේ 4 වන රෙජිමේන්තුව ලෙසින් එක්වු මෙම රෙජිමේන්තුවේ ගමන් මගෙහි ආරම්භය සනිටුහන් කරනු ලැබුවේ ජේෂ්ඨ නිලධාරීන් 06 දෙනෙකුත්, නිලධාරීන් 03 දෙනෙක් සහ සෙසුනිලයින් 79 කින් සමන්විතව 1991 වසරේ ජුනි මස 05 දින 11 වන සේනාංකය යටතේ පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියෙහිදිය.

2016 ජුනි මස 05 දිනට වසර 25 ක සාඩම්බර ඉතිහාසයකට හිමිකම් කියනු ලබන මෙම ඒකකය ඒකක සංවත්සර දිනය සර්ව ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් අභිමානවත්ව පවත්වන ලදි.

2015.10.01 දින සංඥා බලකාධිපතිතුමන්ගේ ඒකක සංචාරයේදි අනුරාධපුර ජය ශ්‍රී මහාබෝධී අංකුරයක් මෙම ඒකක බුද්ධ මන්දිරය අසල දි රෝපණය කරන ලද අතර, එවකට මෙම ඒකක අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කල ලූතිතන් කර්නල් එස්එම් අතුකෝරල පිඑස්සී යන ජේෂ්ඨ නිලධාරීගේ සංකල්පයකට අනුව සිවිල් ගුවන්සේවා අධිකාරියට අයත් භාවිතයෙන් ඉවත්කරන ලද ඇන්ටනොව් වර්ගයේ ගුවන්යානයක් ඒකකයේ සියලුම නිලධාරී හා සෙනීන්ගේ ශ්‍රම දායකත්වයෙන් අළුත්වැඩියාවට ලක්කර සුභසාධක වෙළඳසැල අසල ස්ථාපිත කරන ලදි. සිවිල් අයවළුන් හටද මෙම ගුවන් යානය තුල ආහාර ලබා ගැනිමේ පහසුකම් සලසා ගුවන් යානයකට ඇතුලුවීමේ අත්දැකිම නොමිලේ ලබාදීමට කටයුතු කර ඇත. ඊට සමගාමීව ළමා උද්‍යානයද නවීකරණය කර ඇත.

2016.03.23 දින සංඥා නිලධාරීන් 107 දෙනෙකු සඳහා පුහුණු දිනයක් මෙම ඒකකය වෙතින් වත්මන් අණදෙන නිලධාරී වන ලූතිතන් කර්නල් එකේව් අධිකාරී ශුළුස්පී යන ජේෂ්ඨ නිලධාරීගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉතා සාර්ථකව පවත්වන ලදි. එහිද පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති රිටිගල කන්ද තරණය කිරීම මෙන්ම විශ්‍රාමික වාරිමාර්ග ඉංජිනේරු විජය බස්නායක මහතා හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහකාර අධ්‍යක්ෂක සුමේධ කරුණාරත්න මහතා විසින් ශ්‍රී ලංකාවේ පෞරාණික ස්ථානයන් හා ඉතිහාසය පිළිබඳ ඉතා හරවත් දේශනයක් පවත්වන ලදි.

මෙම ඒකකයේ අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබන ලූතිතන් කර්නල් එකේව් අධිකාරී යුඑස්පී ජේෂ්ඨ නිලධාරීගේ නව සංකල්පයකට අනුව ඒකකයේ නිලධාරීන්/සෙසුනිලයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ දහම් දැනුම වර්ධනය කිරීමේ අරමුණින් විද්වත් දේශකයින් කැඳවා හරවත් ධර්ම සාකච්ඡාවක් පවත්වන ලදි.

2016.04.24 දින සමාජ සත්කාර වැඩසටහනක් වශයෙන් අනුරාධපුර සාලියපුර ශාන්ති වැඩිහිටි නිවාසයේ ශ්‍රමදාන කටයුතු ඒකකයේ භඩ පිරිස් සහභාගිවූ අතර, 2016.04.25 වනදින ශ්‍රී විමල ධර්මදූත විහාරස්ථානයේ ශ්‍රමදාන කටයුතු සඳහා මෙම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගි විය.

2016 වර්ෂයේ සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව 2016.04.29 වන දින ඒකකයේ පැවති අළුත් අවුරුදු උත්සවය සඳහා අනුරාධපුර ප්‍රදේශය අවට පදිංචි ඒකකයේ රාජකාරී නියුතු නිලධාරී සහ සෙසු නිලයින්ගේ පවුල්වල සාමාජිකයින්ද සහභාගිවන ලදි.

ආසේමු (වන්නි) වෙතින් සංවිධානය කරන ලද 2016 වර්ෂයේ සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවයේ, පාපැදි, තරඟයෙන් මෙම ඒකකය නියෝජනය කරන ලද පාපැදි කණ්ඩායමේ තරඟකරුවන් පිළිවෙලින් 1,2,3,4, සහ 9 වන ස්ථානය දක්වා ජයග්‍රහනය හිමිකර ගන්නා ලද අතර, කොට්ටපොර තරඟයෙන් දෙවන ස්ථානයත් විකට ඇඳුම් තරඟයෙන් තෙවන ස්ථානය හිමි කර ගන්නා ලදි.

නිරෝගිමත් හමුදාවක් නිරෝගිමත් දැයක්, සෞඛ්‍ය වැඩසටහන 2016.04.27 දින මෙම ඒකකයේදි සිදුකල අතර ඒ සඳහා අණදෙන නිලධාරී ඇතුලු සියලුම නිලධාරීන් /ජේකොනොනින්/සෙසුනිලයින් සහභාගිවන ලදි.

2015 වසරේදි ආසේමු (වන්නි) බලප්‍රදේශ තුල ස්ථාපිත ඒකකයන්හි අතර පැවැති, කැලිප්සෝ සංගීත, තරඟයෙන් මෙම ඒකකයේ කැලිප්සෝ සංගීත කණ්ඩායම ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදි. ආසේමු (වන්නි)

ආඥාපතිතුමාගේ සංකල්පයකට අනුව පැවැත්වෙන නව නිපැයුම් තරඟාවලිය සඳහා 2015 වසරේදී ජංගම දුරකථනය මගින් නිවසේ විදුලි පද්ධතිය හැසිරවීම මෙන්ම 2016 වසරේදී ත්‍රිත්ව ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික දොර අගුලක් නිර්මාණය කර ඇත.

4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ නිලධාරී සහ සෙසුනිලයින්ගේ අත්දැකීම සහ පුහුණුව තුලින් තව දුරටත් යුද්ධ හමුදාවේ සමස්ථ අණ සහ පාලනයට අප ඒකකය සෘජුවම දායකත්වය ලබාදීමට වර්තමානයේ මෙන්ම අනාගතයේදීත් හැකියාව ලැබේවායි පතමින් සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ටත් සිවිල් සේවක මහතුන්ටත් ඔවුන්ගේ පවුල් වල සියලුම දෙනාටත් සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරන්නෙමු.



16 වන අණදෙන නිලධාරි තුමන්ගේ සංකල්පයකට අනුව ඉදිකල කායවර්ධන මධ්‍යස්ථානය බලකාධිපති තුමන් නිරීක්ෂණය කරන අවස්ථාව.



අලුත්වැඩියා කරන ලද ඇන්ටනොව් වර්ගයේ ගුවන් යානය බලකාධිපති තුමන් නිරීක්ෂණය කරන අවස්ථාව.



2015 වසරේ ආසේමු (වන්නි) බලප්‍රදේශ තුල ස්ථාපිත කැලිප්සෝ සංගීත කණ්ඩායම් තරග අතුරින් මෙම ඒකකයේ කැලිප්සෝ සංගීත කණ්ඩායම ප්‍රථම ස්ථානය හිමි කර ගන්නා ලද අවස්ථාව.



17 වන අණදෙණ නිලධාරි ලෙස ලුතිතන් කර්නල් ඒකේඩී අධිකාරි සුභ මොහොතින් අණදෙන නිලධාරි තනතුරේ වැඩ භාර ගැනිමේ අවස්ථාව.

සැකසුම

කපිතන් එම්එන්ටී ජයසේකර ශ්‍රීලංසංබ



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

## 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය 2014 දෙසැම්බර් මස 15 දින ආසේමු (බටහිර) බලප්‍රදේශයේ සංඥා රාජකාරීන් ඉටු කිරීමට භාරගත් අතර ඒ අනුව ශ්‍රී ලංකාවේ විශාලම භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් දිස්ත්‍රික්ක 09 ක් සඳහා මෙම ඒකක සෙනින් සංඥා රාජකාරීන් සඳහා යොදවා සන්නිවේදන කටයුතු ඉතා සාර්ථකව ඉටුකරමින් සිටි.

මෙම ඒකකයේ ප්‍රධානතම වගකීම වනුයේ ආසේමු (බටහිර) බල ප්‍රදේශයේ සංඥා රාජකාරීන් නිසි අයුරු ඉටු කිරීමයි. ඒ අනුව බලප්‍රදේශයේ පැවැත්වෙන සෑම රාජ්‍ය හා යුද්ධ හමුදා උත්සවයන් සඳහා අවශ්‍ය ජන ඇමතුම් සේවාව මෙම ඒකකය විසින් සපයනු ලබන අතර, බලප්‍රදේශයේ සියලුම දුරකථන මාර්ග නඩත්තුව මෙන් ම හදිසි ආපදා තත්වයන් සහ වෙනත් අවශ්‍යතාවයන් මත අවශ්‍ය ස්ථාන වෙත ගුවන් විදුලි යන්ත්‍ර ලබාදීම හා ක්‍රියාකරුවන් යෙදවීම ද සිදුකරනු ලබයි.

2016 මාර්තු මස දිවයින පුරා සිදුවූ විදුලි බලය ඇනහිටීම් තත්වය යටතේ විදුලි බලාගාර, විදුලි උප පොලවල් හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයන් හි ආරක්ෂාව සඳහා අනුයුක්ත කරන ලද භඨ පිරිස් හා යුද්ධ හමුදා මුලස්ථානය ඉදුරාම සම්බන්ධ කරන සංඥා සම්බන්ධතාවය ලබාදීමේ අභියෝගාත්මක කර්තව්‍ය සංඥා බසේමු උපදෙස් පරිදි ඉතා සාර්ථකව ඒකක අණදෙන නිලධාරීගේ මග පෙන්වීම යටතේ ඉටු කරන ලදී.

එහිදී ආසේමු (බටහිර) බල ප්‍රදේශයේ 14 සේමු සහ 58 සේමු යටතේ දිස්ත්‍රික්ක 09 ක් ආවරණය වන පරිදි පිහිටුවා තිබූ විදුලි බලාගාර හා ග්‍රිඩ් උප පොලවල් 32 ක් සඳහා සංඥා සම්බන්ධතාවය ලබා දෙන ලද අතර 5 ශ්‍රීලංසංබ පනාගොඩ කඳවුර තුල හා ගොන්ගල ප්‍රතිවිකාශන මධ්‍යස්ථානයේ රිපීටර් යන්ත්‍ර සවිකිරීම ද මෙම ඒකකය විසින් සිදු කරන ලදී.

මීට අමතරව ගාලු මුවදොර පිටියේදී 2016/02/04 පැවැති නිදහස් උත්සවය සඳහා ද 2016/05/19 දින බත්තරමුල්ල රණවිරු ස්මාරකය අභියස පැවැති රණවිරු සැමරුම් උත්සවය සඳහා ද සියලුම සන්නිවේදන අවශ්‍යතාවයන් මෙම ඒකකය වෙතින් ලබාදී ඇත.

මෑත කාලයේ රට තුල පැවැති හදිසි ආපදා තත්වයන් වලදී ඒ සඳහා යොදවන ලද භඨ පිරිස් වෙත සංඥා සම්බන්ධතාවය ලබාදීමෙන් හා අදාල සහන කටයුතු සම්බන්ධීකරණය සඳහා රාජ්‍ය ආයතනයන් වෙත ද සංඥා සම්බන්ධතාවය සැපයීම වෙනුවෙන් මෙම ඒකකය විසින් ඉතාමත් වැදගත් කාර්ය භාර්යක් ඉටුකරන ලදී. ඒ අනුව 2016/05/15 දින දෙහිඕවිට ප්‍රදේශයේ නායයෑම සිදුවූ අවස්ථාවේ දිවිගලවා ගැනිම් මෙහෙයුම් සඳහා යොදවා සිටි 4 ශ්‍රීලංසිරෙ ඒකක භට පිරිස් වෙත අවශ්‍ය සංඥා සම්බන්ධතාවය ලබා දීමට ද ක්‍රියා කරන ලදී.

එමෙන්ම 2016/05/15 දින සිට රට තුල පැවැති අධික වර්ෂාව සමඟ ඇති වූ ගංවතුර තර්ජනයේදී ද මෙම ඒකක සෙනින් විශාල කැපකිරීමක් සිදුකරන ලදී. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත මෙම ඒකක සෙනින් සහභාගි කරවා හදිසි ඇමතුම් අංශයේ දුරකථන ක්‍රියාකරුවන් ලෙස ද එහි සංඥා මැදිරීය වෙත ගුවන් විදුලි යන්ත්‍ර ලබාදී ගුවන් විදුලි ක්‍රියාකරුවන් සහභාගි කරවා දිවා රාත්‍රි දෙකෙහිම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය සංඥා සම්බන්ධතාවය සපයන ලදී.



2016.01.27 දින ඒකකයේ 16 වන අණදෙන නිලධාරි වශයෙන් නි/62453 ලුතිතන් කර්නල් බීබී ද්‍රනාන්දු යූඑස්පි පීඑස්සි යන ජ්‍යේෂ්ඨ නිලධාරි වැඩභාරගත් මොහොත.

තවද ශ්‍රිලයුසෙව්බමු වෙත හා ආසේමු (බටහිර) වෙතින් ස්ථාපිත හදිසි ආපදා කළමනාකරණ ක්‍රියාන්විත මැදිරි වෙත අවශ්‍ය සංඥා සම්බන්ධතාවය හා ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවන් ලබාදිම මෙම ඒකකය වෙතින් සිදුකරන ලදි.

2016/05/17 දින අරණායක ප්‍රදේශයේ නායයෑම සිදුවු අවස්ථාවේ දි ප්‍රදේශයේ සියලුම සන්නිවේදන කටයුතු හා විදුලි බලය ඇණහිටි මොහොතක ඒකක අණදෙන නිලධාරි ඇතුලු භඨ පිරිස් ඊට සෘජුවම සහභාගිවී ප්‍රදේශයේ සංඥා සම්බන්ධතාවය නැවත ස්ථාපිත කිරිම සඳහා රිපීටර් සහ අනෙකුත් සංඥා උපකරණ සවිකරමින් ගලවා ගැනිමේ මෙහෙයුම් වල යෙදි සිට 58 සේනාංක භඨ පිරිස් වෙත අවශ්‍ය සංඥා සම්බන්ධතාවය ලබාදිමට ක්‍රියා කරන ලදි.

තවද 2016/06/05 දින කොස්ගම සාලාව කඳවුරේ පතුරොම් ගබඩාවේ පිපිරීම ඇතිවු මොහොතේ ආසේමු (බටහිර) ආඥාපති තුමාගේ සහ ප්‍රධාන සංඥා නිලධාරි තුමාගේ උපදෙස් පරිදි එම ගින්න මැඩපැවැත්වීමට සහ ප්‍රදේශයේ ආරක්ෂාවට යොදවන ලද භඨ පිරිස් වෙත අවශ්‍ය ක්ෂණික සංඥා සම්බන්ධතාවය ලබාදිමට මෙම ඒකක අණදෙන නිලධාරි ඇතුලු භඨ පිරිස් විසින් ක්‍රියා කරන ලද අතර, අදාල ව්‍යසනය හේතුවෙන් අඩපණ වු හමුදා හා සිවිල් ජන පිවිත යලි ගොඩ නැගිමේ භාරදුර කාර්ය සඳහා මේ වන විටත් මෙම ඒකකය දායකත්වය ලබාදෙමින් සිටි. ඒ අනුව කඳවුර තුල හා අවට සිවිල් ගම්මානයන්හි භූමිය පිළිසකර කිරිමේ කටයුතු සිදු කරනු ලබන භඨ පිරිස් හා හානි වු නිවාස නැවත ගොඩනැගිමේ කාර්යන් සඳහා යොදවා සිටින ත්‍රිවිධ හමුදා භඨ පිරිස් වෙත අවශ්‍ය සියලුම සංඥා සම්න්ධතාවය මෙම ඒකකය වෙතින් ලබා දෙනු ලබයි.


2016/05/27 දින ශ්‍රිලයුසෙව්බමු හි පතුරොම් ගබඩාව පිපිරීමෙන් පසු භූමිය නිරුපද්‍රිත කිරීමේ සහ ඉදිකිරීම් කණ්ඩායම සඳහා සංඥා සම්බන්ධතා සපයනු ලබන සංඥා මැදිරිය.

මේ වන විට අදාල වැඩ කටයුතු සඳහා ගුවන් විදුලි යන්ත්‍ර 197 ක ප්‍රමාණයක් ලබාදි ඇති අතර, එහි පිහිටුවා ඇති ගුවන් විදුලි මැදිරියේ ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියා කරුවන් යොදවා එම කටයුතු ක්‍රමවත්ව කරගෙන යාමට අවශ්‍ය සියලුම සංඥා සම්බන්ධතා කටයුතු මේ මොහොත දක්වාම සිදු කරනු ලබයි.

ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් බිඩී ප්‍රනාන්දු යුඑස්පි පිඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මඟ පෙන්වීම යටතේ සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ නොමඳ කැපකිරීම සහ උත්සහය මත බලප්‍රදේශයේ සංඥා සම්බන්ධතාවය නිසිලෙස පවත්වාගෙන යාම පිළිබඳව උසස් මුලස්ථානයන්ගේ නිරන්තර පැසසුමට මෙම ඒකකය පත්වී ඇත.

5 වන සංඥා රෙජිමේන්තුව විසින් මෙතෙක් දේශය වෙනුවෙන් අභිතව කරන ලද උදාර මෙහෙවර අනාගතයේදි ද සාර්ථකව ඉටු කිරීමට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනය කරන්නෙමු.


2016.01.02 දිනට යෙදුන ඒකක 22 වන සංවත්සර උත්සවයේ විශේෂ අවස්ථා.


2016 වර්ෂයේ මෙම ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබූ ක්‍රීඩා තරඟයන්හි ඒකක සෙනින් ක්‍රීඩාවන්හි නිරත වු අවස්ථා.

සැකසුම

කපිතන් එච්එන්පී හෙට්ටිආරච්චි ශ්‍රීලංසංබ





## 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

විශ්වය නම් වු සප්ත මහා සාගරයෙහි පාවෙන රුවල් නැවක් බදු සෞන්දර්යයෙන් පොහොසත් මේ පුංචි ලක් දෙරණෙහි වසර 30 කට අධික කාල පරාසයක් තුල පැවති යුධ ගිණි දැල් නිමාවෙන් පසු උදා වෙමින් පවතින නව අරුණෝදයේ ආශ්චර්යය මධ්‍යයේ තම 20 වන වියට පා තැබු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සන්නිවේදනයේ ප්‍රමුඛයා වන ශ්‍රී ලංකා සංඥා බලකායේ 2 වන ආධාරක බලඇණිය ලෙස 1997.01.10 වන දින ආරම්භ කරනු ලැබු 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය 2014.06.16 වන දින ආධාරක බලඇණි රාජකාරි වලින් මිදි තොරතුරු තාක්ෂණ රාජකාරීන් වෙත අනුවර්තනය වී මේ වන විට එම රාජකාරීන් මනාව ඉටු කරමින් සිටි. තම ගෙවී ගිය වසර 17 ක කාල පරාසයෙහි අතිතාවර්ජනය ද සිග්නලර් සගරාවේ පසුගිය කලාපය තුලින් එළි දැක්වු බැවින් ගෙවී ගිය පසුගිය වසර තුල සිදුවු විශේෂිත සිදුවීම් පමණක් මෙසේ සනිටුහන් කරන්නෙමු.


නව අණදෙන නිලධාරි වශයෙන් නි/61628 ලුතිතන් කර්නල් එච්ඒඅයියු හේවාආරච්චි ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සුභ මොහොතින් රාජකාරි භාරගත් මොහොත.

මේ වන විට මෙම ඒකකය ආසේමු (යාපනය) බල ප්‍රදේශයේ යාපනය නගර මධ්‍යයේ ඉතා සෞන්දර්යාත්මක භූමි ප්‍රදේශයක නවතමයෙන් ඉදිකරන ලද අලංකාර වුත් දර්ශණීය වුත් කඳවුරු භූමියක ස්ථානගතව ඇති අතර, මෙම ඒකක අණදෙන නිලධාරී වශයෙන් රාජකාරී කල ලුතිතන් කර්නල් කේසි ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම යටතේ උසස් මුලස්ථානයන් වෙතින් පැවරෙන රාජකාරීන් හා වගකිම් ද ඉතා උසස් අන්දමින් ඉටුකරමින් සිවිල් වැසියන්ගේද නොමද ප්‍රසාදයට ලක් වෙමින් ඔවුන්ගේ එදිනෙදා ජන පීවිත යේදි පැන නගින්නා වු ප්‍රශ්න හා ගැටලු වෙනුවෙන් ලබාදිය හැකි විසදුම් වෙනුවෙන් උපරීම දායකත්වයක් ලබා දෙමින් ඔවුන්ගේ ජන පීවිතය යලි පුබුදුවාලිම සඳහා සහයෝගය ලබා දෙමින් රාජකාරී ඉටුකරනු ලබයි.

එමෙන්ම ආධාරක බලඇණියක් වශයෙන් 1997.01.10 දින ආරම්භ කල මෙම ඒකකයේ 19 වන සංවත්සරය 2016.01.10 දිනට යෙදී තිබු අතර, එදින I වන අධියර යටතේ එම කාලයේ මෙම ඒකකය යටතේ රාජකාරී කර ක්‍රියාන්විත රාජකාරීයේදි පිවිත පුදකල රණවිරුවන් හට නිවන් සුව ප්‍රාර්ථනය කිරීම සඳහාත් තුවාල ලබා ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය පිණිසත් සර්ව ආගමික වතාවත් සිදු කරන ලදි. අනතුරුව II වන අධියර යටතේ 2016.06.16 දින තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් ආරම්භ කල මෙම ඒකකයේ 2 වන සංවත්සරයට සමගාමීව 2016.06.16 වන දින අණදෙන නිලධාරී තුමන් හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, එදිනම මහත් උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කරන ලද සියලු නිල සුහද හමුවක් ද පවත්වන ලදි. අනතුරුව 2016.06.17 වන දින මෙම ඒකකයෙහි රෙජිමේන්තු සැරයන් මේජර් තනතුර හෙබවූ හා දැනට යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ලබා ගොස් සිටින සියලුම රෙජිමේන්තු සැරයන් මේජර් වරුන්ගේ සහභාගීත්වයෙන් යුතුව පවත්වන ලද බනි/සැරයන් නිවස්න සාදය ද මේ වන විට මෙම ඒකකය එදා හා මෙදා අතර, ඇති වෙනස මනාවස් පිළිඹිබු වන්නක් විය. තවද බනි/සැරයන් නිවස්න සාදයට සමගාමීව මෙම ඒකක සියලු බලලත් නිලධාරී/ජ්‍යෙෂ්ඨ කොනොනින්ගේ මුලපමය හා ශ්‍රම දායකත්වයෙන් නවතමයෙන් ඉදිකරන ලද බලලත් නිලධාරී විවේකාගාරය ද තොරතුරු තාක්ෂණ ඒකකයේ පලමුවන අණදෙන නිලධාරී වන නි/61623 ලුතිතන් කර්නල් කේසී ප්‍රතාපසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ සුරතින් විවෘත කරන ලදි. එමෙන්ම 2016.06.18 වන දින සන්ධ්‍යාවේ දි මෙම ඒකකයට අණදීම් කරන ලද හා මේවන විට විශ්‍රාම ලබා සිටින අණදෙන නිලධාරී වරුන්ගේ හා ප්‍රධාන ආරාධිත ජ්‍යෙෂ්ඨ නිලධාරී



සංඥා බලකා ගීතය එළිදැක්වීමේ අවස්ථාවට සහභාගී වූ සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේ ආර් පී රොවෙල් ආර්ඩබ්පීයූඑස්පී එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමා විසින් පොල්තෙල් පහන දල්වන ලදඅවස්ථාව



2016.08.07 දින අභිනවයෙන් ඉදිකළ නව ස්වයං පුහුණු විද්‍යාගාරය සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේ ආර් පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමා නිරීක්ෂණය කල අවස්ථාව



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

## කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 72 ක් සපිරෙන ඓතිහාසික අවස්ථාවේ වාර්ෂිකව පලකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම පිළිබඳව අවංකවම සතුටු වෙමි.

මීට වසර දාහතකට ප්‍රථම ආරම්භ කරන ලද මෙම සඟරාව තුලින් සංඥා බලකායේ වසරක් පුරා සිදුවූ කාලීන සිදුවීම් සෑම සාමාජිකයෙකුටම දැන ගැනීමටත්, ඔවුන්ගේ නිර්මාණශීලී හැකියාව විදහා දැක්වීමට හා තම දැනුම වර්ධනය කර ගැනීමටත් මනා පිටුවහලක් වන බැව් නොඅනුමානය. අප විරෝධාර සෙබළුන් හට මෙම කලාපය තුලින් තම නිර්මාණාත්මක අදහස් එළිදැක්වීමට ඉතා හොඳ තෝතැන්නක් සැකසෙන අතර, ඒ සඳහා සියලුම මූලස්ථාන හා ඒකකයන්හී නිලධාරී / සෙසු නිලයින් විසින් දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

තාක්ෂණයෙන් පිරිපුන් හමුදාවක් ගොඩ නැංවීමෙහිලා යන ගමන් මගෙහි නවක සාමාජිකයින් හට මෙහි පල කරන අධ්‍යාපනික ලිපි මගින් ලබා ගන්නා තොරතුරු මහඟු අත්වැලක් වන අතර, වර්ථමාන ලෝකයේ තාක්ෂණික දියුණුවත් සමඟ ආරක්ෂක හමුදාවන් භාවිතා කරන තාක්ෂණික උපකරණ / උපක්‍රම හා විශේෂිත වූ හමුදාමය පරිගණක වැඩසටහන් පිළිබඳව විශේෂ අවධානය යොමුකර එයට මුහුණදීම සඳහා සංඥා බලකාය වශයෙන් වූ කාර්යභාරයක් ඉටුකල යුතුව ඇති බැව් ද සිහිපත් කිරීමට කැමැත්තෙමි.

අවසාන වශයෙන් මෙම සඟරාව සිත්ගන්නා සුළු අයුරින් හා හරවත් අයුරින් සකස් කර මුද්‍රණය කිරීම සඳහා දායක වූ සංඥා බලකාධිපතිතුමා ඇතුළු සියලුම නිලධාරීන් සහ සෙසු නිලයන්ටත්, කාලෝචිත හා නිර්මාණශීලී අදහස් හා නිර්මාණයන්ගෙන් දායක වූ සැමටත් කෘතඥතාපූර්වකව ස්තුතිවන්ත වන අතර, මෙවර කලාපය අලංකාර අන්දමින් සංස්කරණය කර ඔබ අතට පත් කිරීමට කටයුතු කළ සංස්කාරක මණ්ඩලයටත් ප්‍රධාන කර්තෘ වශයෙන් මා ප්‍රශංසාව පුද කරමි.

### ප්‍රධාන සංස්කාරක

කර්නල් කේ ඒ ඩබ්. එස් රත්නායක
ලුතිතන් කර්නල් එන් පී ඒ මෙන්ඩිස් පීඑස්සී ශ්‍රීලංසංබ
මේජර් ඩී එම් එස් දිසානායක පීඑස්සී ශ්‍රීලංසංබ
මේජර් ටී ඩී ටී විජේසිංහ ශ්‍රීලංසංබ
කපිතන් එන් ඒ ඒ පී නාපාගොඩ ශ්‍රීලංසංබ

### ග්‍රැෆික් නිර්මාණය

ලා/කෝ බමුණුසිංහ බී ඒ එන් යු
සංසෙ පීරිස් එස් ආර් ඒ එම්

### මුද්‍රණය

AMP ප්‍රින්ටින් පුද්ගලික ආයතනය
නො 54, නුවරඑළිය පාර, ගම්පොළ
දුරකථන : 077 787 5165
081 235 0345

### සෝදුපත් කියවීම

ලුතිතන් කර්නල් එම්ඒආර්එස්කේ මල්ලවආරච්චි ජාශිබ
ලුතිතන් ඩීවීඑන් ධර්මප්‍රිය ශ්‍රීලංසංබ

### ලිපිනය

රෙජිමේන්තු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා සංඥා බලකාය,
යුද හමුදා කඳවුර,
පනාගොඩ,
හෝමාගම.
දුරකථන : +94112855361
ඊමේල් : rhqslsc@army.lk
වෙබ් : www.army.lk/signaller



ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් නි/63217 මේජර් ඩබ්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී යන ජ්‍යේෂ්ඨ නිලධාරී රාජකාරී භාරගත් මොහොත.

වශයෙන් ආරක්ෂක සේනා මූලස්ථානය යාපනය ආඥාපති මේජර් ජෙනරල් එන්යූඑම්එම්ඩබ් සේනානායක ආර්ඩබ්පි ආර්එස්පි යූඑස්පි පීඑස්සි ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සහභාගිත්වයෙන් යුතුව මෙම ඒකක නිලධාරී නිවස්නයේ සුහද හමුවක් ඉතා උත්සවශ්‍රීයෙන් සමරන ලදි.

එසේම, මෙම ඒකකය තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් ප්‍රතිව්‍යුහගත වීමෙන් පසුව ඒකකයේ වත්මන් අණදෙන නිලධාරී වශයෙන් 2016.07.09 වන දින සිට නි/61628 ලුතිතන් කර්නල් එච්එඅයියු හේවාආරච්චි ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සුභ මොහොතින් රාජකාරී භාරගත් අතර, තොරතුරු තාක්ෂණ ඒකකයේ පළමුවන දෙවන අණදෙන නිලධාරී වශයෙන් නි/63217 මේජර් ඩබ්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2015.10.21 වන දින සිට මේ දක්වා රාජකාරී කරනු ලබයි.

තවද ආසේමු (යාපනය) බල ප්‍රදේශය තුල පවත්වනු ලැබූ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය, වෙසක් පුන් පොහොය දින නිමිති කොට ගෙන පැවති වෙසක් උත්සවය වැනි උත්සව මාලාවන් සඳහා මෙම ඒකක භට පිරිස්හි නොමද දායකත්වය ලබා දෙන ලදි. එමෙන්ම යාපනය ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ජන ජීවිතය ඔප් නැංවීම සඳහා පවත්වනු ලබන නොයෙකුත් සුභසාධක වැඩ සටහන් හා උත්සව මාලාවන්ට මෙම ඒකකය වෙතින් සහයෝගය නිරතුරුවම ලබා දෙමින් සිවිල් සම්බන්ධීකරණ කටයුතු මනාව ඉටු කිරීම හේතුවෙන් සිවිල් ජන සමාජය තුලද ජනාදරයට පාත්‍රව ඇත.

මෙම ඒකක නිලධාරීන් හා සෙසු නිලයින්ගේ ක්‍රිඩා කුසලතාවයන්ද මේවන විට උසස් මට්ටමක පවතින අතර, කැරම් ක්‍රිඩාවෙන් අන්තර් රෙජිමේන්තු තරඟාවලි නියෝජනය, 2016 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක වෙඩි තැබීමේ තරඟාවලියේ ශුරතාවය දිනා ගැනිම, 2016 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක රගර් තරඟාවලි ශුරතාවය දිනා ගැනිම හා 2016 සංඥා රෙජිමේන්තු අන්තර් ඒකක ජිම්නාස්ටික් තරඟාවලි ශුරතාවය දිනා ගැනිම වැනි ජයග්‍රාහණ රැසක් හිමිකර ගෙන ඇත. තවද ආසේමු (යාපනය) බල ප්‍රදේශය තුල සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන හා ඒකකයන් වෙතින් පවත්වනු ලැබූ ක්‍රිඩා තවලියන්හි ජයග්‍රහණ රැසක් ද හිමිකර ගැනිම තුලින් ඒකකයේ ක්‍රිඩා කෞෂල්‍ය මනාසේ විදහාපායි.

තවද ඒකක සෙබලුන්ගේ නිල උසස් කිරීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් නිල උසස් කිරීමේ පාඨමාලාවන් ද ඒකකය තුලහිදීම පවත්වනු ලැබූ අතර, අනෙකුත් සංඥා ඒකකයන් වෙතින් හා සංඥා පාසල වෙතින් පවත්වනු ලැබූ වෘත්තීමය හා නිල උසස් කිරීම් පාඨමාලාවන් සඳහා වැඩි වශයෙන් මෙම ඒකක සෙබලුන් රපෝර්තු කරවීම තුලින් ඔවුන්ගේ වෘත්තීය දැනුම වැඩි දියුණු කිරීමටත් ඉදිරි හමුදා දිවිය සාර්ථක කර ගැනිමටත් කටයුතු කරනු ලබයි. එයට අමතරව අනෙකුත් සුභසාධක කටයුතු පිලිබදව සොයා බලා ක්‍රියා කිරීම තුලින් සෙබලුන්ගේ චිත්ත ධෛර්‍යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇති අතර, එමගින් ඔවුන් වෙත පැවරෙන රාජකාරීන් කැපවීමෙන් හා වගකීමෙන් මෙන්ම උනන්දුවෙන් ඉටුකිරීම මේ වන විට මෙම ඒකකය ලබා ඇති සාර්ථකත්වයට බලපා ඇති ප්‍රධාන කරුණකි.

මෙම ඒකකය සංඥා බලකා පවුලට එක්වී දැනට වසර 19 කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති අතර, එම කාල පරාසය තුල ඒකකයේ සාර්ථකත්වයට අණදෙන නිලධාරීවරුන් 15 දෙනෙකු නායකත්වය ලබා දී ඇත. වත්මන් අණදෙන නිලධාරීගේ නායකත්වය හා මඟපෙන්වීම යටතේ ඒකකයේ පාලන කටයුතු හා සෙබඑන්ගේ සියලූම සුභසාධක කටයුතු ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. එබැවින් එය ඒකකයේ ඉදිරි ගමන් මගෙහි සාර්ථකත්වයට ඉමහත් පිටුවහලකි.





තම 19 වන කඩඉම පසුකරමින් 20 වන කඩඉම වෙත සාර්ථකව පියමනින 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවි හිමියෙන් හා කාය දානයෙන් රාජකාරී කල සියලූම නිලධාරී/ සෙසුනිලයින් හටද, දැනට රාජකාරීයේ යෙදී සිටින සියලූම නිලධාරී /සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරමින් මෙවන් වූ මෙහෙවරක් ඉටුකල 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකා නාමය සංඥා බලකාය තුල පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස වැජඹෙන්නට ප්‍රාර්ථනා එක් කරමින් පසුගිය වසරෙහි අභිතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.



අන්තර් සංඥා ඒකක වෙඩි තැබීමේ කුසලානය ලබාගත් මොහොත.



රණවිරු වරප්‍රසාද කාඩ්පත් ඒකක අණදෙන නිලධාරි විසින් පිරිනැමූ අවස්ථාව.



අන්තර් සංඥා ඒකක වෙඩි තැබීමේ කුසලානය ඒකක අණදෙන නිලධාරි වෙත පිරිනැමූ මොහොත.



ඒකකයේ 19 වන සංවත්සරය දා පැවැත්වූ RNR වැඩසටහනෙහි විශේෂ අවස්ථාවක්.



ඒකක රගර් කණ්ඩායම විසින් අන්තර් සංඥා ඒකක රගර් කුසලානය ලබාගත් මොහොත

සැකසුම
මේජර් ඩබ්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී ශ්‍රීලංසංබ




ඒකක සෙනින්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් නවතමයෙන් ඉදිකල සෙසුනිල හඨ නිවාසය සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යූඑස්පි එන්ඩියු පිඑස්සි තුමන් විසින් සුභ මොහොතින් විවෘත කල අවස්ථාව.

එමෙන්ම ලින්ක් නැචුරල් පුද්ගලික සමාගමේ අනුග්‍රාහක දායකත්වය මත මෙම ඒකකය විසින් පවත්වන ලද කිරි සමඟ සමහන් දන්සැල සහ ඒකක නිලධාරී/සෙනින්ගේ දායකත්වය මත පවත්වන ලද මංසද්කෙදාක්කා දන්සැල ඉතාමත් සාර්ථක අයුරින් පැවැත්වීමට හැකිවිය.

තවද, ආරක්ෂක සේනා මුලස්ථානය මධ්‍යම අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ෆොක්ස්හිල් ග්‍රීන් වනවගා ව්‍යාපෘතිය සඳහා ද මෙම ඒකකය සක්‍රිය ලෙස දායක වෙමින් මේ වන විට මෙම ඒකකය වෙත වෙන්කල භූමිභාගය තුල පලතුරු පැළ 110 ක් සිටුවා හොඳින් නඩත්තු කරනු ලබන අතර එම පැළ හොඳින් දළුදමා උසස් තත්වයෙන් පවතින බව සතුටින් දන්වා සිටිමු. සංඥා බලකාධිපතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක සිවිල් සේවක මහතුන්ගේ විවේක ප්‍රකෘතිමත් කිරීමේ වැඩසටහන යටතේ මෙම ඒකක සිවිල් සේවක මහතුන් 16 දෙනෙකුගේ පවුල්වල සාමාජිකයින් 39 දෙනෙක් වෙනුවෙන් අඹේවෙල එඩෙයරි ෆාම් කිරිගොව්පොලේ සහ නුවරඑළිය ග්‍රෙගරි උද්‍යානයේ සිදු කරන ලද අධ්‍යාපනික සහ විනෝද චාරිකාව සහ සුහද හමුව සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්හට අමතක නොවන රසබර අත්දැකීමක් ගෙනදුන් බව මෙහිදි සතුටින් සිහිපත් කරන්නෙමු.

දියතලාව මැණික්කන්ද ප්‍රදේශයේ මනරම් භූමි භාගයක නවතමයෙන් ස්ථාපිත මෙම ඒකකයේ ඉදිකිරීම් කටයුතු ඒකකයේ අනෙකුත් රාජකාරීන් මධ්‍යයේ සීඝ්‍රයෙන් සිදුවෙමින් පවතියි. ඒ වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරී, අනෙකුත් නිලධාරීන් සහ සියලුම සෙසු නිලයින් විසින් ලබා දෙන ලද දායකත්වය සහ කැපවීම මත පසුගිය වර්ෂයේදි කඳවුර තුල නව මුරහලක්, සෙසුනිල හඨ නිවාසයක් සහ බනි/සැරයන් නිවස්න මුලුතැන්ගෙයක්, යුද්ධ හමුදා ප්‍රතිපාදන නොමැතිව සම්පූර්ණයෙන්ම සාදා නිමකොට සෙබල අයිතියට පත්කිරීමට හැකිවීම ඒකකය ලද සුවිශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කරන්නෙමු. තවද, මේ වන විටත් 2016 වර්ෂයේ යුද්ධ හමුදා මූලධන සේවාවන් සඳහා වෙන් කල ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම කටයුතු සිදු කරමින් පවතින නව සෙසුනිල භෝජනාගාර ගොඩනැගිල්ලේ සහ යුද්ධ හමුදා ප්‍රතිපාදන නොමැතිව සිදුකරනු ලබන නිලධාරී නිවස්න ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුද ඒකකයේ සියලුම සාමාජිකයින්ගේ කැපවීම මත කඩිනමින් නිම කිරීමට අපේක්ෂා කරන්නෙමු.

අභිමානවත් සන්නිවේදන මාධ්‍යයෙන් සමස්ථ යුද්ධ හමුදාවට දායකත්වය ලබාදීමට නවතමයෙන් පිවිසුණු 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ ඉදිරි ගමන් මඟ සාර්ථක කරගැනිමට සියලු නිලධාරීන් හට සහ සෙසු නිලයින් හට අවශ්‍ය ශක්තිය සහ ධෛර්‍යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

තවද, ඒකකය දියතලාව ප්‍රදේශයේ ස්ථාන ගතවීමෙන් අනතුරුව නව ස්ථානයේ මේ දක්වා ගොඩනැගීමට, එහි අභිවෘද්ධියට ඇවැසි ගුරුහරුකම් ලබාදෙමින්ද, නන් අයුරින් උපකාර කරමින් හා සංඥා බලකායේ අභිවෘද්ධියට නිරතුරුවම තම කාලය කැපකරන හිටපු සංඥා බලකාධිපතිවරුන්, වත්මන් බලකාධිපතිතුමන්, ප්‍රධාන සංඥා නිලධාරී තුමන්, වත්මන් සංඥා බලසේනාධිපතිතුමන් හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමු.







7 ශ්‍රීලංසංබ සෙනින් විසින් දියතලාව - නරියාකන්ද ප්‍රදේශයේ හටගත් ලැව් ගින්නක් සාර්ථකව වළර්ව කරනු ලබන අවස්ථාවක්.



ඒකක 8 වන සංවත්සරය නිමිත්තෙන් යුද්ධයේදි මියගිය / ආබාධිත තත්වයට පත් සෙනින් සහ ඒකකයේ දැනට සේවයේ නියුතු නිලධාරීන්/සෙනින්/සිවිල් සේවක මහතුන් හට සෙත්පතා කහගොල්ල ආරණ්‍ය සේනාසනයේ පවත්වන ලද බෝධි පූජා පිංකමේ අවස්ථාවන්.



ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය මගින් සංවිධානය කරන ලද "සුපර් ක්‍රොස් " මෝටර් රථ ධාවන තරගයේ ක්‍රියාත්විත මැදිරියේ රාජකාරීයේ නියුතු අවස්ථාවක්.



මෙම ඒකක සෙනින් විසින් වලමණ්ඩිය බලඇණි පුහුණු පාසැල තුල ස්ථාපනය කරන ලද සංඥා කුලුණේ ඉදිකිරීම් සිදුකරන අවස්ථාව.

සැකසුම
කපිතන් ආර්එම්පීඑ මුත්තෙට්ටුගේ ශ්‍රීලංසංබ

## 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

වර්ෂ 2016 ක්වූ ජූලි මස 15 වන දින 8 වන වියට පා තබන 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය කිලිනොච්චිය ඉරණමඩු මංසන්ධිය අසල භූමි භාගයක පිහිටුවා ඇත. 2008 වසරේ ශ්‍රී ලංකා සංඥා බලකායේ කණිෂ්ඨතම රෙජිමේන්තුව ලෙස පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දී ආරම්භ වූ මෙම ඒකකය අණදෙන නිලධාරීන් 05 දෙනෙකුගේ අණදීම ලැබ වර්තමානයේදී අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන්ගේ මෙහෙයවීම යටතේ ආරක්ෂක සේනාව කිලිනොච්චියෙහි සංඥා සම්බන්ධතා රාජකාරීන් ඇතුළු අනෙකුත් රාජකාරී ඉටුකරමින් සිටියි.

8 වසරක ඉතිහාසයක් ඇති 9 වන සංඥා බලකාය මේ වන විට තම වගකීම් හා යුතුකම් ඉතා විශිෂ්ඨ අයුරින් ඉටුකරමින් සාර්ථක ගමන් මගකට පිවිස සංඥා බලකායේ ලාබාලතම ඒකකය වශයෙන් 2010,2011 සහ 2012 වර්ෂයේ අනෙකුත් සංඥා ඒකක අභිබවා තෙවතාවක්ම සංඥා රෙජිමේන්තුවේ හොඳම ඒකකය බවට පත්වී ශූරතාවය හිමිකර ගෙන ඇත. ඒ සඳහා දායකත්වය ලබාදුන් මීට ප්‍රථම රාජකාරී හෙබවූ අණදෙන නිලධාරීවරුන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම අනෙකුත් නිලධාරීන් හා සෙසුනිලයින්ද මෙහිදී ඉතා ගෞරවයෙන් යුතුව සිහිපත් කරන අතර, වර්තමාන අණදෙන නිලධාරීතුමාගේ නායකත්වය හා මාර්ගෝපදේශණය තුලින් මෙම ඒකකය භෞතික සම්පත් අතින් මෙන්ම ගුණාත්මක බවින්ද පිරිපුන් ඒකකයක් බවට පත්වී ඇත්තේය.



ආරක්ෂක සේනාව කිලිනොච්චිය ආඥාපති මේජර් ජේනරාල් කේ්ඩ්ඩ් කරුණාසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන්ගේ සංචාරය.



අභිනවයෙන් ඉදිකෙරුණු ඒකක ස්වයං පුහුණු විද්‍යාගාරය නිරීක්ෂණය කිරීමේ අවස්ථාව.



7 වන අණදෙන නිලධාරිතුමන් ලෙස ලුතිතන් කර්නල් පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන්ගේ වැඩ භාරගැනීමේ අවස්ථාව.



ලුතිතන් කර්නල් පීඩීවී ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ නිලධාරි පෙළපාලිය නිරීක්ෂණය කිරීමේ අවස්ථාව.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

මෙම වසරේ පැවති තරඟාවලීන් අතුරින් අන්තර් සංඥා ඒකක සරඹ තරඟාවලිය, කරාතේ තරඟාවලිය, කැරම් තරඟාවලිය හා කඹ ඇදීමේ තරඟාවලින් හිදි මෙම ඒකකය දෙවන ස්ථානය හිමි කරගැනීමට සමත්වී ඇත. තවද අන්තර් සංඥා ඒකක රගර්, මල්ලවපොර හා පැසිපන්දු තරඟාවලින්ගෙන් මෙම ඒකකය තෙවන ස්ථානය හිමිකරගෙන ඇති අතර ඒකක බලප්‍රදේශයේ ස්ථානගත බලඇණි අතර පැවති එල්ලේ තරඟාවලියේ දී මෙම ඒකකයෙහි තෙවන ස්ථානය හිමි කරගනිමින් ඒකක සෙනින් දක්ෂතා දැක්වූහ.



පැසිපන්දු තරඟාවලියේ උද්යෝගිකර අවස්ථාවක්.



මාර්ග බාධක රාජකාරී පිළිබඳ අභ්‍යාසයක නිරත සිසුන්.

ඒකක සෙනින් ඇතුළු වෙනත් ඒකක සෙනින්ගේද පුහුණු කටයුතු කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් නිල උසස් කිරීමේ පාඨමාලා හා වෘත්තිය පරීක්ෂණ පුහුණු පාඨමාලාද රැසක් සංවිධාන කෙරිනි.

ඒකක ගමන් මගෙහි තවත් එක් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් සත් වන අණදෙන නිලධාරීතුමන් ලෙස ලුතිතන් කර්නල් පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමනගේ වැඩ භාරගැනීම 2016/07/26 වන දින සුභ මොහොතින් සිදුවුනි.

අට වසරක් ඉතිහාසයක් ඇති 9 වන සංඥා බලකාය මේ වන විට තම වගකීම් හා යුතුකම් ඉතා විශිෂ්ඨ අයුරින් ඉටුකරමින් සාර්ථක ගමන් මගකට පිවිස සංඥා බලකායේ ලාබාලතම ඒකකය වශයෙන් 2010, 2011 සහ 2012 වර්ෂයේ අනෙකුත් සංඥා ඒකක අභිබවා තෙවතාවක්ම සංඥා රෙජිමේන්තුවේ හොඳම ඒකකය බවට පත්වී ශූරතාවය හිමිකර ගෙන ඇත. ඒ සඳහා දායකත්වය ලබාදුන් මීට ප්‍රථම රාජකාරී හෙබවූ අණදෙන නිලධාරීවරුන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙන්ම අනෙකුත් නිලධාරීන් හා සෙසුනිලයින්ද මෙහිදී ඉතා ගෞරවයෙන් යුතුව සිහිපත් කරන අතර, වර්තමාන අණදෙන නිලධාරීතුමාගේ නායකත්වය හා මාර්ගෝපදේශණය තුලින් මෙම ඒකකය භෞතික සම්පත් අතින් මෙන්ම ගුණාත්මක බවින්ද පිරිපුන් ඒකකයක් බවට පත්වී ඇත්තේය.



පාඨමාලා සෙනින් අධ්‍යයන කටයුතු වල නිරත වෙමින්.

සැකසුම
මේජර් පීපීඑල්සී කුමාරසිරි ශ්‍රීලංසංබ

## 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1 වන සංඥා රෙජිමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව යුධ හමුදාව තුල වු ඉලෙක්ට්‍රොනික හා ගුවන් විදුලි/දුරකථන උපකරණ අළුත්වැඩියා කටයුතු ඉටුකිරීම සඳහා සංඥා මූලික වැඩපල ඛණ්ඩය සංඥා බලකායට එක් වු අතර, එය 1 ශ්‍රීලංසංබ, 2 වන බලඝණය යටතේ එම් ඛණ්ඩය ලෙස ස්ථාපනය කරන ලදී. යුධ හමුදා සංවිධානයෙහි ව්‍යාප්තිය හා සමගාමීව සංඥා බලකාය ද ව්‍යාප්ත වු අතර, යුධ හමුදාව වෙත ලබා ගන්නා ලද නව තාක්‍ෂණික ගුවන් විදුලි උපකරණ, දුරකථන හුවමාරු හා දුරකථන උපකරණ, රේඩියෝ රිලේ උපකරණ හා වෙනත් ඉලෙක්ට්‍රෝනික උපකරණ පිළිබඳ අලුත්වැඩියා/නඩත්තු කටයුතු පහසු කරමින් ඛණ්ඩයක් වශයෙන් වු සංඥා මූලික වැඩපල, සංඥා මූලික වැඩපල බලඝණයක් ලෙස ව්‍යාප්ත විය. 1 ශ්‍රීලංසංබ යටතේ සහ පසුකාලීනව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ පහත ඛණ්ඩයන්ගෙන් සමන්විතව නව මුහුණුවරකින් සිය කාර්‍යයන් ඉටු කරන ලදී.

* ගබඩා ඛණ්ඩය
* එම් 1 ඛණ්ඩය සිට එම් 9 ඛණ්ඩය දක්වා

වර්ෂ 1991 අගෝස්තු මස 01 දින සිට වර්ෂ 2000 වර්ෂයේ අගෝස්තු 13 දින දක්වා සංඥා මූලික වැඩපල බලඝණය, බලඝණ නිලධාරී අණදෙන්නන් 08 දෙනෙකු යටතේ සිය කාර්මික වගකීම් යුධ හමුදාවට ඉටු කල අතර, මෙම වකවානුව තුල ශ්‍රී ලංකාව තුල පැවති බෙදුම්වාදී ත්‍රස්ථවාදී යුද්ධයේදී තාක්‍ෂණික හා කාර්මික රාජකාරී අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කරන ලදී. වර්ෂ 2000 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරී 24 ක් හා සෙසුනිලයන් 513 කින් සමන්විත වු ව්‍යුහයකින් යුක්තව 28/2001 හා 2001 අගෝස්තු මස 21 දින දරණ හමුදා චරියා නියෝග මඟින් සංඥා මූලික වැඩපල ස්වාධීන ඒකකයක් ලෙස සංඥා බලකායට එක්විය. මූලස්ථානය, බළඝණ 05 කින් හා ක්ෂේත්‍ර සංඥා වැඩපල 05 කින් ද මධ්‍යම සංඥා වැඩපලකින් සමන්විත වන අතර, එම සංයුතිය ඇතිව 2015.04.24 දින සංඥා මූලික වැඩපල නැවත ප්‍රතිස්ථාපනය වෙමින් 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා රෙජිමේන්තුවේ නව ඒකකයක් වශයෙන් පිහිටුවන ලදී.

ඉන් අණතුරුව 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ පලමුවන අණදෙන නිලධාරී වශයෙන් ලුතිතන් කර්නල් කේඑම්පී බණ්ඩාරනායක ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමා 2015.09.16 දින දක්වා කටයුතු කිරීමෙන් අණතුරුව 2015.09.17 දින මෙම ඒකක නව අණදෙන නිලධාරීතුමන් ලෙස ලුතිතන් කර්නල් එපි වික්‍රමසේකර යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් වැඩ භාර ගන්නා ලදී.



නව අණදෙන නිලධාරී ලෙස ලුතිතන් කර්නල් ඒපි වික්‍රමසේකර යුඑස්පී පීඑස්සී යන ජ්‍යේෂ්ඨ නිලධාරිතුමන් වෙත සම්මාන මුරය පිරිනමන අවස්ථාව.



නව අණදෙන නිලධාරී ලෙස ලුතිතන් කර්නල් ඒපි වික්‍රමසේකර යුඑස්පී පීඑස්සී යන ජ්‍යේෂ්ඨ නිලධාරිතුමන් වැඩ භාර ගැනීමේ අවස්ථාව.





යුද්ධය අවසන් වී වසර හතක් ගෙවීමෙන් පසු 68 වන නිදහස් දින උත්සව පෙළපාලිය සඳහා දායකත්වය ලබා දෙන ලදී. මෙම උත්සවවල සියලුම ජන ඇමතුම් රාජකාරී මෙම ඒකකය වෙත පැවරුනු අතර, මෙම ඒකක නිලධාරීන් හා සෙසුනිලයින් විසින් ඉතාමත් සාර්ථකව එම සේවාවන් අවසන් කිරීමට හැකිවීම ද මෙම පෙළපාලියේ මෙම ඒකකය විසින් සංවිධානය කරන ලද ගුවන් විදුලි යන්ත්‍ර රැගත් රථ පෙළපාලිය ඉතාමත් උසස් අයුරින් සංවිධානය කරගැනිමට හැකිවීම හා ප්‍රථම වරට මෙම ඒකකය විසින් නිදහස් දින පෙලපාලිය සඳහා සංඥා මැදිරි ක්‍රියාකාරීත්වය හා විවිධ රැහන් වර්ගයන් පෙන්නුම් කරමින් නිර්මාණය කරන ලද රථය මෙවර නිදහස් දින පෙලපාලිය සඳහා ඉදිරිපත් කිරීමට හැකිවීම ද අප ලැබූ තවත් ජයග්‍රහනයක් සේ සැලකිය හැකිය.



68 වන නිදහස් දින උත්සව පෙළපාලිය සඳහා දායකත්වය ලබාදෙන අවස්ථාව



සංඥා බලකාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන ක්‍රීඩා පිටියේදී පවත්වන ලද සියලු නිල සුහද හමුවේ විශේෂ අවස්ථාවන්

# 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



*අණදෙන නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලබන කර්නල් එස්පීපී පක්ෂවීර ජ්‍යෙෂ්ඨ නිලධාරිතුමන් වෙනුවෙන් පිරිනමන ලද සම්මාන මුරය*

වර්ෂ 1991 අගෝස්තු මස 23 වන දින සිට සංඥා බලකාය යටතේ විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය නමින් ඒකකයක් පිහිටුවන ලද අතර, මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පරිගණක ක්ෂේත්‍රයේ දිගු ගමණක ආරම්භයක් විය. එදින සිට පරිගණක ක්ෂේත්‍රය මෙන්ම එහිදි භාවිතා කරන වචනද දිනෙන් දින යාවත්කාලීන වු අතර, විද්‍යුත් දත්ත යන වචනය මෙම භාගය වන විට භාවිතයෙන් ඉවත්ව තොරතුරු තාක්ෂණ නමින් භාවිතයට පැමිණියේය. ඒ අනුව මෙතෙක් භාවිතා කල නාමය 2003 ඔක්තෝබර් මස 14 වන දින සිට සංශෝධනය වී තොරතුරු තාක්ෂණ ඒකකය නමින් භාවිතා විය.

2005 වර්ෂයේ සිට තොරතුරු තාක්ෂණ ඒකකය ස්වාධීන සේවා ඒකකයක් වශයෙන් යුද්ධ හමුදා මුලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ ක්‍රියාත්මක වු අතර, එය රෙජිමේන්තුවක් වශයෙන් නිසි අයුරු ස්ථාපනය වන තෙක් එහි සියලු පාලන කටයුතු රෙම ශ්‍රීලංසංබ වෙතින් ඉටු කරන ලදි. එහි ප්‍රතිඵලයන් වශයෙන් ඒකකයෙහි ඇතුලත් තොරතුරු තාක්ෂණ නිලධාරී/ නිලධාරිණියන් සහ දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරුවන් / ක්‍රියාකාරිණියන් හා ඒකකය සතු උපකරණ ද ඇතුලු සියලු රාජකාරී කටයුතු 2009 නොවැම්බර් 05 දින සිට ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය යටතේ ක්‍රියාත්මක වීම සඳහා අනුමැතිය ලබාදෙන ලදි.

වර්ෂ 2010 ක් වු සැප්තැම්බර් මස 21 දින සිට තොරතුරු තාක්ෂණ ඒකකය නැවත ප්‍රතිස්ථාපනය වෙමින් 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා රෙජිමේන්තුවේ නව ඒකකයක් වශයෙන් පිහිටුවන ලදි. වර්ෂ 2016 සැප්තැම්බර් මස 21 දිනට වසර 06 ක සාඩම්බර ඉතිහාසයක් සපිරී මෙම ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් 2010 සැප්තැම්බර් මස 21 දින සුභ මොහොතින් ලුතිතන් කර්නල් පීඑන්යු ජයරත්න යුඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම යටතේ ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේ දි ආරම්භ කරන ලදි. එතැන් සිට එම කාල පරාසය තුල ඒකකයේ සාර්ථකත්වයට අණදෙන නිලධාරීවරුන් තිදෙනෙකු යටතේ නායකත්වය ලබාදී ඇත.

වත්මන් අණදෙන නිලධාරී වන කර්නල් එස්පීපී පක්ෂවීර යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නායකත්වය හා මගපෙන් වීම යටතේ ඒකකයේ සියලුම අංශයන් හී ඉදිරි කටයුතු ඉතා උසස් අන්දමින් ඉටු කිරීමේ හැකියාව ලැබී ඇති අතර, එය ඒකකයේ සාර්ථකත්වය සඳහා ඉමහත් පිටුවහලක් වී ඇත. මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් ඩීඑම්එස් දිසානායක පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරන අතර, විධායක අධිකාරී වශයෙන් කපිතාන් ජේඑම්ඩී නුවන් යන නිලධාරී විසින් කටයුතු සිදු කරනු ලබයි. ඒකකයේ රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බනි II අරුණ ශාන්ත ආර්ඩී කටයුතු කරන අතර, ප්‍රධාන සරඹ උපදේශක වශයෙන් බනි II ජයලත් එච්ඩබ්ආර් සහ ප්‍රධාන ලිපිකරු වශයෙන් බනි II අමරතුංග ඩබ්එජේ යන ජ්‍යෙකොනොනීන් විසින් රාජකාරීන් සිදු කරනු ලබයි.

6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය තොරතුරු තාක්ෂණ ඒකකයක් බවට පත්වීමෙන් අනතුරුව 2016 ජනවාරි මස මුල් භාගයේදි ජ්‍යෙකොනොනීන් ඇතුළුව සෙනින් 119 දෙනෙකු අන්තර් ඒකක මාරුවීම් මත මෙම ඒකකය වෙත ඇතුලත් කරන ලදි.

6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ සෙනින් සංඥා රෙජිමේන්තු වට ආවේණික වෘත්තින් වල යෙදුන ද, ඔවුන් මෙම ඒකකය වෙත පැමිණී මෙන් පසු ඔවුන්ගේ සහ අනිකුත් සංඥා ඒකක සෙනින්ගේ පරිගණක දැනුම වර්ධනය කිරීම සහ වඩාත් ඵලදායි පරිගණක ක්‍රියාකරුවන් බිහිකිරීම වෙනුවෙන් මෙම ඒකකය වෙතින් සියලුම පහසුකම් සහිත පරිගණක විද්‍යාගාරයක් වත්මන් ඒකක අණදෙන නිලධාරීගේ සංකල්පයකට අනුව 2016 මාර්තු මස 15 වන දින සංඥා බලකාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදි.

ඒකකයේ සෙනින් පිටත ස්ථානයන්හී රාජකාරීන් කරන බැවින් ඔවුන්ගේ පහසුව පිණිස මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ නිල උසස් කිරීම් හා වෘත්තීය පරීක්ෂණ සිදුකිරීමට කටයුතු සිදු කරන ලදි. මෙහිදී ඒකක සෙබලුන්ට තම සුදුසුකම් සම්පූර්ණ කර ගැනිමට මහත් පිටුවහලක් වී ඇති බැවි සතුටින් දන්වා සිටිමු.

11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය යටතේ පාලනය වන නැණසල තාක්ෂණික සහාය ආයතනය බෝධිරාජාරාමය පනාගොඩ හෝමාගම යන ස්ථානයේ පිහිටා ඇති අතර, එමගින් යුද්ධ හමුදාව සහ සිවිල් පුද්ගලයින් හට සහනදායි මිල ගණන් යටතේ පහත සඳහන් සේවාවන් සිදු කරනු ලබයි.

- යතුරු ලියනය (Type Setting)
- මුද්‍රණය කළු/සුදු සහ වර්ණ (Printing Black & white / Colour )
- ඡායාරූප පිටපත් (Photo Copy)
- ලැමිනේටින් (Laminating)
- පොත් බැදීම (Binding)
- මෝස්තර නිර්මාණකරණය (Graphic Design)
- අන්තර්ජාල පහසුකම් (Internet Browsing)
- විද්‍යුත් තැපැල් (E - Mail)

සංඥා බලකාධිපතිතුමාගේ උපදෙස් මත මෙම ඒකකයේ සෙබලිය න් සඳහා නවතමයෙන් ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ලේ ඉහළ මහලය ලබා දෙන ලද අතර, සෙබලුන් සඳහා විදුලි පංකා, ඩයලොග් TV ඇතුළු සියලු පහසුකම් වලින් සමන්විත ගොඩනැගිල්ලක් ලබා දෙන ලදි.

එමගින් සෙබල සෙබලියන්ගේ ජීවන රටාව වඩාත් පහසු හා ක්‍රමවත් භාවයකට පත්වී ඇති බැවින් එය මෙම ඒකකය ලද සුවිශේෂී ජයග්‍රහණයක් බව පෙන්වා දෙමි.

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල පැවති අන්තර් ඒකක ක්‍රීඩා තරඟාවලියන් සඳහා මෙම ඒකකය සහභාගි වු අතර, එමගින් මෙවර බාස්කට් බෝල් තරඟාවලියෙන් දෙවන ස්ථානය හිමිකර ගැනිමත්, ටේබල් ටෙනිස් තරඟාවලියෙන් තුන්වන ස්ථානය හිමිකර ගැනිමත්, ගෘහස්ථ ඔරු පැදීම් තරඟාවලියේ (කාන්තා) රන් පදක්කම් දිනාගැනීමත් මෙම ඒකකයට ඉමහත් කීර්තියක් ගෙන එන ලදි.

යුද්ධ හමුදාපතිතුමාගේ සංකල්පයකට අනුව මියගිය රණවිරුවන්ගේ ලඟම ඥාතින් හා ආබාධිත රණවිරුවන් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය අධියර 02 යටතේ සංඥා බලකාධිපති තුමාගේ සහ ඒකක අණදෙන නිලධාරීතුමාගේ මඟපෙනවීම යටතේ මෙම ඒකකයේ සියලු නිලධාරී/ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයක් ලබාදී වාද්දුව ප්‍රදේශයේ නව නිවසක් රෙම ශ්‍රීලංසංබ වෙතින් ලබා දුන් මුදලින් ඉදිකර ඇති අතර, අදාල නිවස නුදුරේදි සෙ/284548 කෝප්‍රල් සුසන්ත ඒඑස් යන කොනොනි හට පරිත්‍යාග කිරීමට සියලු කටයුතු සුදානම් කර ඇත.



*සෙ/284687 ලා/කෝ තිලකරත්න කේඒඑන්එන්*

2016 ජුනි මස 20, 21 හා 22 යන දිනයන් තුල වැලිසර නාවික හමුදා කඳවුරේ දී පවත්වන ලද 2016 ආරක්ෂක සේවා වුෂු තරඟාවලියේ 56 වන බර පන්තිය යටතේ තරග කරනු ලැබූ සෙ/284687 ලා/කෝ තිලකරත්න කේඑන්එන් කාන්තා සෙබලිය විසින් නොකඩවා තුන් වන වරටත් රන් පදක්කමක් දිනාගනිමින් ශ්‍රී ලංකා සංඥා බලකායට කීර්තියක් ගෙන දුන් අතර, එම තරඟාවලිය සඳහා 65 වන බර පන්තිය යටතේ තරග කරනු ලැබූ සෙ/285717 සංසෙ(කා) ප්‍රියදර්ශනී බීකේසී විසින් ද මෙම තරගාවලියේදී රන් පදක්කමක් දිනා ගැනීමට සමත් වූ බව ඉතා සතුටින් දන්වා සිටිමු.

යුද්ධ හමුදාව නියෝජනය කරමින් 2016 අප්‍රේල් මස සීගිරිය යොවුන් පුරයේදී පැවැත්වූ පිරික්සුම පහන් සංදර්ශණයට සහභාගී වූ සෙබලියන් අන් කණ්ඩායම් අභිබවා තම දක්ෂතා සංදර්ශණ භූමියේ විදහා දක්වන්නට විය.



*සෙ/285700 සංසෙ (කා) රන්දි වීඩ*

ඒකකයේ නිලධාරීන්ගේ හා සෙසු නිලයින්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් වාර්ෂිකව පවත්වනු ලබන එතෙර හා මෙතෙර පාඨමාලාවන් රාශියකට නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ සහභාගීත්වය ඉතා ඉහල මට්ටමක පවතින අතර, එමගින් ඒකකයට දැනුමෙන් පිරිපුන් සෙබලුන් පිරිසක් බිහිවී ඇති බව ඉතාමත් සතුටට හේතුවක් වී ඇත.



සියලුම පහසුකම් සහිත පරිගණක විද්‍යාගාරයක් වත්මන් ඒකක අණදෙන නිලධාරිගේ සංකල්පයට අනුව 2016.03.15 වන දින සංඥා බලකාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදි.



ඒකක සංවත්සරය වෙනුවෙන් පැවැත් වු සියලු නිල සුහද හමුව.



නැණසල තාක්‍ෂණික සහාය ආයතනය පිහිටුවීම.



ශ්‍රී ලංකා යුධ හමුදාවේ මෙන්ම සිවිල් සමාජය තුල නොයෙකුත් උත්සව අවස්ථාවන් වල මෙම ඒකක *LED* පැනල් තිර පද්ධතිය ලබාදීම සිදු කරනු ලබයි.



ටේබල් ටෙනිස් තරගාවලියෙන් තුන්වන ස්ථානය මේජර් ඩීඑම්එස් දිසානායක පීඑස්සී හිමිකරගත් අවස්ථාව.



ආසේමු (බටහිර) වෙතින් ඉදිරිපත් කර තිබු වෙසක් පහන් කූඩු අතරින් දෙවන ස්ථානයට දිනා ගැනීමට 11 ශ්‍රීලංසංබ ඒකකයට හැකිවිය.

**සැකසුම**

**මේජර් ඩීඑම්එස් දිසානායක පීඑස්සී ශ්‍රීලංසංබ**



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

## 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තාක්‍ෂණ දියුණුවත් සමගම නුතන සයිබර් අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ පරමාර්ථය පෙර දැරී කොටගෙන නව සංඥා රෙජිමේන්තුවක් සංඥා බලකායට දායාද කරන ලදි. මෙය යුද හමුදා චර්යා නියෝග ARO 24/2015 අනුව 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ලෙස පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ දී ආරම්භ කරන ලදි. 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වෙන්වුයේ සයිබර් ආරක්‍ෂණ ඒකකයක් ලෙසය. මෙම ඒකකයේ කෙටි නාමකරණය 12 SLSC(CS) වේ. මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කර්නල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීයෙකු විසින් අණදෙනු ලබන ප්‍රථම රෙජිමේන්තුව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉතිහාසයට එක් වේ. මෙහි ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන් කර්නල් එස්පීපී පක්‍ෂවීර යන ජ්‍යෙෂ්ඨ නිලධාරී පත් කොට තිබේ.

**ARMY ROUTINE ORDER**

**ARO 24/2015** **RAISING INSTRUCTIONS** **G/SD/51/04 ( )**

**12 REGIMENT SRI LANKA SIGNAL CORPS (CYBER SECURITY)**

**GENERAL**

1. The Commander of the Army has approved the raising of the 12 Regiment Sri Lanka Signal Corps (Cyber Security) of the Regular Force with effect from 10 July 2015. The abbreviated title will be 12 SLSC (CS).

**CHAIN OF COMMAND**

2. 12 Regiment Sri Lanka Signal Corps (Cyber Security) will be placed under command to the Regimental Centre, Sri Lanka Signal Corps for administrative matters and for operational matters under the Headquarters Chief Signal Officer with the supervision of Director Information Technology. 12 Regiment Sri Lanka Signal Corps (Cyber Security) will be commanded by a Commanding Officer in the rank of Colonel.

3. Commanding Officer, 12 Regiment Sri Lanka Signal Corps (Cyber Security) will be responsible for the overall command, control and discipline of the Officers and the Other Ranks posted to the Regiment.

**LOCATION**

4. 12 Regiment Sri Lanka Signal Corps (Cyber Security) will be located at Army Cantonment, Panagoda, HOMAGAMA.

**ESTABLISHMENT**

5. The Establishment of the 12 Regiment Sri Lanka Signal Corps (Cyber Security) is as per the Annex 'A' to Directorate of Staff Duties letter G/SD/219 (104) dated 17 July 2015.



11 සේනා මූලස්ථානය වෙතින් වෙසක් උත්සවය නිමිත්තෙන් පවත්වන ලද වෙසක් පහන් කූඩු තරගය සඳහා ඉදිරිපත් කරන ලද පහන් කූඩුව.




2016.07.18, 19, 20 යන දිනයන්හී ඉන්දියානු කාර්මික ඇගයීම් කමිටුවේ සමාජිකයින් සංඥා පුහුණු පාසල නිරීක්ෂණ චාරිකාවක යෙදුණු අවස්ථාව.

වසරකට ආසන්න කාලයක් මෙම පුහුණු පාසලේ රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස කටයුතු කල බනි 1 එච්පීඑන්සීකේ රත්නායක යන බලලත් නිලධාරී වසර 22 ක අභිමානවත් සේවා කාලය අවසන් කර 2016.03.01 දින විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගිය අතර ඔහු වෙනුවෙන් සංඥා පුහුණු පාසලේ සෙසු නිලයින් විසින් දිවා භෝජන සංග්‍රයක් පිරිනමන ලදි. තත් බලලත් නිලධාරී රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් කටයුතු කරන ලද කාලසීමාව තුල සංඥා පුහුණු පාසලේ ඇති වූ දියුණුව සඳහා සෘජු දායකත්වයක් ලබාදුන් බලලත් නිලධාරී වරයෙකි. මෙම පුහුණු පාසලේ වර්ථමාන රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි 11 අබේවික්‍රම එච්එස් යන බලලත් නිලධාරී 2016.03.08 එම තනතුරේ වැඩ ආරම්භ කරන ලදි.

මෙම වර්ෂයේ මෙම පුහුණු පාසල තවත් පියවරක් ඉදිරියට තබමින් පුහුණු පාසල තුල නව තාක්ෂණික විද්‍යාගාර පිහිටුවීම සඳහා ඉන්දියානු කාර්මික ඇගයීම් කමිටුවේ සමාජියින් වන Col Sushil Chadwani සහ Nb Sub Yogesh Kumar යන අයවළුන් 2016.07.18, 19, 20 යන දිනයන්හි පුහුණු පාසල නිරීක්ෂණ චාරිකාවක යෙදෙමින් ඒ සඳහා මූලික පිඹුරුපත් සකස් කිරීමට කටයුතු කිරීම සුවිශේෂී අවස්ථාවක් බැව් පෙන්වා දෙමි.

මෙම සියලු සංසිද්ධීන් තුලින් පුහුණුව අපේක්ෂාවෙන් මෙම පාසලට පැමිණෙන සියලුම සාමාජිකයින් වෙත සන්නිවේදන පුහුණු කේෂ්ත්‍රයේ උපරිම ප්‍රථිපල ලබාදෙමින් සාර්ථක පුහුණු පාසලක් වශයෙන් දිගු ගමනක යෙදීම මෙම පුහුණු පාසලේ අධිෂ්ඨානය බැව් අවසන් වශයෙන් සටහන් කරමි.

ඒ අනුව නුදුරු අනාගතය තුලදී සංඥා පුහුණු පාසල තුල පුහුණුව ලබන නිලධාරීන් හා සෙනින් වෙනුවෙන් ඉන්දියානු යුද්ධ හමුදාවේ දායකත්වයෙන් අංග සම්පුර්ණ රේඩියෝ, ලයින් හා ප්‍රකාශ තන්තු විද්‍යාගාර සංකිර්ණයක් ඉදි කිරීමට කටයුතු සිදුවෙමින් පවති.



සංඥා නිලධාරීන්ට හා රෙජිමේන්තු සංඥා නිලධාරීන් හට ඩයලොග් ආයතනයේ උපදේශක පිරිසක් විසින් ප්‍රකාශ තන්තු තාක්ෂණය පිළිබඳ පැවැත්වූ වැඩමුලුවට සහභාගී වූ පිරිස සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016



සංඥා නිලධාරීන්ට හා රෙජිමේන්තු සංඥා නිලධාරීන් හට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අන්තර්ජාල හා සන්නිවේදන අධ්‍යන අංශයේ ප්‍රධාන ආචාර්ය අසිත බණ්ඩාරණායක මහතා විසින් ප්‍රකාශ තන්තු තාක්ෂණය පිළිබඳ දේශණයක් නිලධාරී නිවස්නයේ පැවැත්වූ අවස්ථාව.



රෙජිමේන්තු සංඥා නිලධාරී පාඨමාලා අංක 47 පාඨමාලාව සඳහා රේඩියෝ ප්‍රායෝගික පුහුණුව මීමුරේ ප්‍රදේශයේ පැවැත්වූ අතර එම ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසය සඳහා සහභාගී වූ පිරිස.



විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාවේ දේශනයක් අතරතුර.



පරිඝණක පාඨමාලාවක් සඳහා දේශනයක් අතරතුර.




නවතමයෙන් ඉදිකරන ලද "ස්වයං අධ්‍යන පියස හා සන්නිවේදන පුහුණු විද්‍යාගාරය" සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් කේආර්පී ...ාවෙල් ආර්ඩබ්පී යුඑස්පී එන්ඩීයු පීඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් නිරීක්ෂණය කල අවස්ථාව.



6 ශ්‍රීලංසංබ හා 11 ශ්‍රීලංසංබ ඒකක සෙනින් බලඇණි පුහුණුවීම් සිදු කරනු ලබන අවස්ථාවක්.

**සැකසුම**
**ලුතිතන් ඩීවීඑන් ධර්මප්‍රිය ශ්‍රීලංසංබ**

## සංඥා බලකා ගීතය

මව්බිම දිනවන ජයටැඹ වෙත යන
ස්ථිර ක්‍ෂණික ගුණ නැණ බල පිරි
අපි ශ්‍රී ලංකා සංඥා බලකායයි ........ //

නව විදු ලොව නැගි දියුණුව
ගෙන එඩියෙන් මව්බිම සරසමු
නිමැවුම් නව දැන නිසැකව
විදු එළියෙන් හෙට ලොව දිනනෙමු

රුපු සෙන් බලමුළු සිඳබිඳ
විද්‍යුත් සංග්‍රාමික තෙද
අපි දිවි දෙමු රණබිම් වැඳ
සිත් පැසසුම් සතොසින් විඳ

මව්බිම දිනවන ජයටැඹ වෙත යන
ස්ථිර ක්‍ෂණික ගුණ නැණ බල පිරි
අපි ශ්‍රී ලංකා සංඥා බලකායයි ........ //

සංඥා සිප් සෙත නංවන
ශිල්ප සදන තොරතුරු තාක්‍ෂණ
නිති සළසමු පොදු ජන සෙත
නංවමු ලක්මව ලොව දස අත

සයුර ගුවන බිම රජයන
සුමිතුරු බලමුළු යා කොට
නිසි මග ගෙන යන අප බලකායට
නිති පතනෙමු කිත් පැසසුම් ජය ........

මව්බිම දිනවන ජයටැඹ වෙත යන
ස්ථිර ක්‍ෂණික ගුණ නැණ බල පිරි
අපි ශ්‍රී ලංකා සංඥා බලකායයි ........ //

පද රචනය :- ලුතිතන් කර්නල් ඩබ්ලිව්එස්එන් ප්‍රනාන්දු
සංගීතය :- විශාරද ජගත් වික්‍රමසිංහ මහතා

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

## සංඥා සරඹ තනුව
## SIGNAL MARCH

### Begone, dull care

Begone, dull care !
I prithee begone from me;
Begone, dull care!
Thou and I can never agree //
Long while thou hast been tarrying here,
And fain thou wouldst me kill;
But I' faith, dull care,
Thou never shalt have thy will.//

Too much care
Will make a young man grey;
Too much care
Will turn an old man to clay //
My wife shall dance, and I shall sing,
So merrily pass the day;
For I hold it is the wisest thing,
To drive dull care away. //

Hence, dull care,
I'll none of thy company;
Hence,dull care,
Thou art no pair for me.
We'll hunt the wild boar through the world,
So merrily pass the day;
And then at night, o'er a cheerful bowl,
We'll drive dull care away.

2016 ජුලි මස 04 වන දින ශ්‍රී ලංකා සංඥා බලකායට වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් අභිනවයෙන් 'සංඥා ගීතය' එළිදැක්වීම සිදුකරන ලදී. එම සංඥා ගීතය එළිදැක්වෙන මෙම සුවිශේෂී අවස්ථාවේ මේ දක්වා ශ්‍රී ලංකා සංඥා බලකායෙහි සංඥා පෙළපාලි ගී තේමාව වශයෙන් භාවිතයට ගැනෙන බ්‍රිතාන්‍ය රාජකීය සංඥා බලකායෙහිද පෙළපාලි ගී තේමාව වන "Begone Dull Care" ගීතය පිළිබඳව සටහනක් තැබීම කාලෝචිතය.

රාජකීය සංඥා බලකායෙහි පෙළපාලි ගී තේමාව ප්‍රථමයෙන්ම එම බලකායෙහි සංගීත කණ්ඩායමෙහි අධ්‍යක්‍ෂක වශයෙන් 1926 සිට 1939 දක්වා කාල පරිච්ඡේදයෙහි කටයුතු කල Major R R Ricketts, යන නිලධාරී විසින් නිර්මාණය කරන ලදී.

සම්ප්‍රදායික ගී තනුවක් වන "Begone Dull Care" සහ "New Castle" අනුසාරයෙන් සැදුම්ලත් රාජකීය සංඥා බලකා පෙළපාලි සීඝ්‍ර පා ගමන් ගී තේමාව 1960 දශකයෙහි බලකායෙහි සංගීත අධ්‍යක්‍ෂක වශයෙන් කටයුතු කල Lt Col C H Pike විසින් සම්පාදනය කරන ලද්දකි.

"Begone Dull Care" යනුවෙන් ජනප්‍රිය සරල ගීතයෙහි පුරාතණය බ්‍රිතාන්‍ය පාලනය කල දෙවන ජේම්ස් අධිරාජ්‍යයේ රජ සමය (1685-1688) දක්වා අතීතයක් සනිටුහන් කරන අතර එහි මූලික සම්පාදනය ප්‍රංශ ගී පද මාලාවකින් උපුටා ගැනීමක් විය හැකි යැයි අනුමාන කර ඇත.

මෙහි නූතන ගී පද මාලාවන් යෝක්ෂයර් ප්‍රාන්ත ඉපැරණි ජන ගායනයන් ඇසුරෙන් උපුටාගෙන ඇත. මෙම ගීතයෙහි තෙවන පද මාලාව බටහිර යෝක්ෂයර් ප්‍රාන්තිකයන් විසින් ගයනු ලැබුවද ගීතයෙහි මුද්‍රිත පද මාලාවට ඇතුලත්ව නොමැත.

සැකසුම :- කර්නල් එල්එස්පී පෙරේරා යූඑස්පී



## සංඥා බලකා ආදර්ශ පාඨය

ශ්‍රී ලංකා සංඥා බලකායෙහි ආදර්ශ පාඨය ස්ථිර ක්ෂණික වේ. මෙය බ්‍රිතාන්‍ය රාජකීය සංඥා බලකාය ද භාවිතා කළ ලතින් භාෂාවෙන් සඳහන් "Certa Cito" යන්නෙහි සිංහල පරිවර්තනය වන අතර එය ඉංග්‍රීසි භාෂාවෙන් "Swift and Sure" ලෙස සඳහන් වේ. මෙම ආදර්ශ පාඨය මගින් යුද හමුදාවෙහි පැවැත්ම උදෙසා ඉඳුරාම බලපානු ලබන විශ්වාසදායී සන්නිවේදනය හා තොරතුරු හුවමාරුව සැපයීමෙහි ලා සංඥා බලකායට ආවේණික වෘත්තීය නිපුණතාවය පෙන්නුම් කෙරේ.

## සංඥා බලකා ධජය

ශ්‍රී ලංකා සංඥා බලකායට ආවේණික වර්ණයන් වන තද කොළ (Dark Green), තද නිල් (Dark/Oxford Blue) හා ලා නිල් (Sky Blue) යන වර්ණයන්ගෙන් ද බලකා ලාංඡනයෙන්ද සමන්විතව ශ්‍රී ලංකා සංඥා බලකා ධජය නිර්මාණය කොට තිබේ. මෙම ධජයෙහි ඉහත වර්ණයන් පිළිවෙලින් තද කොළ වර්ණය පහළින්ද තද නිල් වර්ණය මධ්‍යස්ථවද ලා නිල් වර්ණය ඉහළින්ද සිටින සේ තිරස්ව දිස්වන අතර බලකා "මර්කරි" ලාංඡනය ඉහත වර්ණ තුන පසුබිම් කොට ධජය මධ්‍යයෙහි ඉස්මතු කොට දක්වා තිබේ. මෙම ත්‍රෛවර්ණ පසුබිමක් මත පිළිබිඹු වන බලකා ලාංඡනය සහිත ධජය මගින් ගොඩ, දිය සහ අහස යන තුන් තලයෙහි ඵලදායි සන්නිවේදනය ගොඩනංවා පවත්වාගෙන යාමෙහි ශ්‍රී ලංකා සංඥා බලකාය සතු වෘත්තීයමය හැකියාව විදහා පායි.

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

## පටුන

01 පණිවුඩ
06 ඉතිහාසයෙන් බිඳක්
12 මතක පොතින්
58 ක්‍රීඩා
68 අප නොදත් යටගියාව
74 ඇස ගැටුනු තැන්
83 පාඨමාලා
85 මණ්ඩාකිණිය
93 කැටපත් පවුර
98 උපන්දින සුභ පැතුම්
106 මංගල සීනු
110 ගෞරවනීය උපහාර








## සංඥා බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරීගේ පණිවුඩය



වසර 73 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකායේ 9 වන බලකාධිපති වශයෙන් "ද සිග්නලර්" සඟරාවේ 18 වන කලාපය වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මා අතිශයින්ම සතුටට පත් වෙමි. වර්තමාන යුද්ධ හමුදාව තුළ තාක්ෂණික උපකරණ හා පරිඝනක උපකරණ භාවිතා කරමින් යුද්ධ හමුදා සන්නිවේදන ජාලයන් උසස් මට්ටමකට ගෙන එම සඳහා ශ්‍රී ලංකා සංඥා බලකාය ලබාදුන් අසීමිත දායකත්වය සංඥා බලකාධිපති වශයෙන් මා මෙහිදී සිහිපත් කරනුයේ ඉතා අභිමානයෙනි.

අප මාතෘ භූමියට පූර්ණ කාලීන සාමය ලඟා කරදීම සඳහා තම ජීවිතය කැපකල සියලුම සංඥා නිලධාරීන්/සෙසුනිලයන් සහ සටනේදී ආබාධිත තත්වයට පත් සියලුම නිලධාරී/සෙසුනිලයන්ට මාගේ ගෞරවය හා ආචාරය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගන්නෙමි.

එමෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ තොරතුරු තාක්ෂණය ඉහළ මට්ටමකට ගෙන එම සඳහා සංඥා බලකාය තුළ ඒකක ප්‍රතිසංවිධානය කර 6 ශ්‍රීලංසංබ ඒකකය තොරතුරු තාක්ෂණ ඒකකයක් බවට ප්‍රතිව්‍යුහගත කිරීම සහ අන්තර්ජාලය ඔස්සේ යුද්ධ හමුදාවට එල්ල විය හැකි සයිබර් ප්‍රහාර වළක්වා ගැනිම සඳහා සයිබර් ආරක්ෂක ඒකකයක් ස්ථාපනය කිරීම, ශ්‍රී ලංකා සංඥා බලකාය වෘත්තිමය වශයෙන් ලද විශාල ජයග්‍රහණයක් ලෙස සලකමි.

30 වසරක කුරිරු යුද්ධය නිමාවී ගත වු කාලය තුළ සංඥා බලකායේ නිලධාරීන්/සෙසුනිලයින්ගේ යටිතල පහසුකම්, සුභසාධන කටයුතු, පුහුණුවීම් හා තාක්ෂණික සංවර්ධනයේ පැහැදිලි ප්‍රගමනයක් දක්නට ලැබීම හා විශාල ලෙස පැවති පරිපාලන ගැටලු සියල්ල පසුගිය කාලය තුළ අවසන් කිරීමට හැකිවීම බලකාය ලද තවත් එක් ජයග්‍රහණයක් ලෙස සලකමි.

නිලධාරී/සෙසුනිලයින්ගේ සුභසාධන කටයුතු විධිමත් කිරීම තුළින් ඔවුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ මට්ටමක තබා ගැනිමට ක්‍රියාකර ඒ තුලින් ඵලදායි සේවයක් ලබාගැනිමට හැකිවන බැව් මා විශ්වාස කරන බැවින් සුභසාධන කටයුතු තව දුරටත් ක්‍රමවත්ව සිදුකිරීම සඳහා අවැසි ක්‍රියාමාර්ග මේ වනවිට ගනිමින් සිටිමි.

බලකායේ නිලධාරී/සෙසුනිලයන්ගේ නිර්මාණ හැකියාවන් වර්ධනය කිරීම/ එළිදැක්වීම සඳහාත් පුරා වසරක් තුළ බලකාය තුල සිදුවන සුවිශේෂී අවස්ථා සෑම සාමාජිකයෙකුටම දැනගැනිම සඳහාත්, බලකායට අලුතින් එක්වන සාමාජිකයින් හට බලකාය පිළිබඳ පුලුල් දැනුමක් ලබාදීම සඳහාත්, සංඥා බලකාය යුද්ධ හමුදාව තුළ ප්‍රචලිත කිරීම සඳහාත් සෑම වසරක් පාසා එළිදක්වන "ද සිග්නලර්" සඟරාව දිනෙන් දිනම දියුණුවට පත්වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමි.

අවසන් වශයෙන් සංඥා බලකායේ දැනට සේවයෙන් විශ්‍රාම ගෙන සිටින ශ්‍රී ලංකා සංඥා බලකා සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල අයටත්, දැනට සේවයෙහි නිරතව සිටින සියලුම නිලධාරීන්/සෙසුනිලයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, නිරන්තරයෙන් අප හා එක්ව කටයුතු කරන සිවිල් සේවක කාර්ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සාමය සතුට සපිරි සෞභාග්‍යමත් සුභ අනාගතයක් උදෙසා සුභාසිංශනය කරමි.

කේ ආර් පී රොවෙල් ආර්ඩබ්පී යුඑස්පී එන්ඩියු පීඑස්සී
මේජර් ජෙනරාල්
සංඥා බලකාධිපති



## අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණගේ පණිවුඩය

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලයෙහි අධ්‍යක්ෂක වශයෙන් 18 වන "ද සිග්නලර්" සඟරාව සඳහා මා මෙම පණිවිඩය නිකුත් කරනුයේ හදපිරි සතුටිනි. අපි සියලු දෙනා පිළිගත් හමුදාවක සාමාජිකයන් වශයෙන් ඉතා මෑත අතීතයෙහි සටන් භූමිය තුල අපගේ ස්වෛරීතාවය සහ ගුණාත්මක භාවය පිළිබිඹු කළෙමු. එනමුදු වර්තමානයේ මුළු මහත් යුද්ධ හමුදාවම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම හා හැකියාවන් ප්‍රධාන හා අත්‍යවශ්‍යම සාධකයක් වූ යුගයකට මුහුණලා සිටියි. එවැනි වු පසුබිමක් තුළ සංඥා සෙබළුන් හා නිලධාරීන්හට තම තාක්ෂණික දැනුම, අත්දැකීම් හා නිර්මාණශීලි හැකියාවන් "ද සිග්නලර්" සඟරාව හරහා ප්‍රදර්ශණය කිරීමට ඉඩප්‍රස්ථාව ලබාදීම ඉතාමත් අගය කළයුතු කටයුත්තකි.

වර්ථමානයෙහි, ලොව සියලු යුද්ධ හමුදාවන් මෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුලද ජාලගත පරිගණක භාවිතයෙහි සිදුව ඇති සිඝ්‍ර දියුණුවත් සමඟ සයිබර් ප්‍රහාර වලින් එම පරිගණක සහ උපාංග ආරක්ෂාකර ගැනීම කෙරෙහි විශාල අවශ්‍යතාවයක් පැනනැගී ඇත. එවැනිවු සයිබර් ප්‍රහාර මැඩපැවැත්වීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් විවිධ වු සයිබර් ආරක්ෂණ වැඩපිලිවෙලවල් ආරම්භකොට ඇති අතර ඒ සඳහා 12 වන සංඥා රෙජිමේන්තුව පිහිටුවීමට ද කටයුතු සම්පාදනය කොට ඇත. සයිබර් ආරක්ෂණ බලඝණය, තවමත් එහි මුලික අවධියෙහි පසු වුවද දැනටමත් එවැනි වු අභියෝග ජය ගැනීම සඳහා යුද්ධ හමුදා දත්ත ජාලය තුළට අනවසර ඇතුල්වීම් පාලනය කිරීම සඳහා වු පද්ධතියක් (Intrusion Prevention System) නිපදවීම, සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සයිබර් විගණන කණ්ඩායමක් ගොඩනැගීම හා බලාත්මක කිරීම ආදී වූ විවිධ පියවර සම්පාදනය කොට ඇත.

එමෙන්ම ප්‍රධාන සංඥා නිලධාරී මධ්‍යස්ථානය හා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය මගින් ශ්‍රී ලංකාවේ පළමුවරට පරිගණක ව්‍යෝහාරාත්මක අධ්‍යනයන් (Computer Forensics) සඳහා ම වෙන්වු පරිගණක විද්‍යාගාරයක් ගොඩනැගීමට ද පිඹුරුපත් සකසා ඇත. මෙම පරිගණක විද්‍යාගාරය ඉතාමත් දියුණු තොරතුරු ආරක්ෂණ මෘදුකාංග හා දෘඩාංග වලින් සමන්විත වන අතර ඉන් සමහරක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල පළමුවරට භාවිතයට ගැනීමට නියමිත වේ. වර්ථමානයේ දී එවැනි වූ සමහරක් මෙහෙයුම් ආරම්භකොට ක්‍රියාත්මක වෙමින් ද පවතී. අනාගත අභියෝග ජය ගැනීම සඳහා විද්‍යුත් සංග්‍රාමික මෙහෙයුම් ද ඇතුලත්වූ සයිබර් ආරක්ෂණ හා විද්‍යුත් සංග්‍රාමික මධ්‍යස්ථානයක් පිහිටුවීම මෙම බලගණයේ ප්‍රධානතම අනාගත අරමුණයි.

තවද තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සේවයකරන සියලුම තොරතුරු තාක්ෂණ වෘතීය වේදීන්හට තොරතුරු තාක්ෂණ අංශයේ අභිවෘද්ධිය සඳහා ඔවුන් දක්වන ලද විශිෂ්ඨවු දක්ෂතාවය ඇගයීම සඳහා මෙය අවස්ථාවක් කරගැනීමට ද මම කැමැත්තෙමි.

අවසාන වශයෙන් මෙවැනි අධ්‍යාපනික වටිනාකමක් ඇති සඟරාවක් පලකිරීම සඳහා ගන්නා ලද මෙම ව්‍යායාමය සඳහා "ද සිග්නලර්" සඟරාවෙහි කර්තෘ මණ්ඩලයට මගේ හදපිරි කෘතඥතාවය පලකිරීමට කැමැත්තෙමි. සයිබර් හා විද්‍යුත් චුම්භක මාධ්‍ය පිළිබඳ තොරතුරු බෙදා ගැනීම සඳහා වු ස්ථිරසාර දායකයෙකු ලෙස "ද සිග්නලර්" සඟරාවේ අනාගත ගමන් මග දෙස මම ඉතාමත් ඕනෑකමින් බලාසිටිමි.

කේ එම් ආර් පී කරුණාතිලක පීඑස්සී
බ්‍රිගේඩියර්
තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ





## සංඥා බලසේනාධිපතිගේ පණිවුඩය



ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පල කරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 18 වන කලාපය වෙනුවෙන් සංඥා බලසේනාධිපති වශයෙන් පසුගිය වසරක කාලයක් සංඥා බලකා මාතාව පැමිණි ගමන් මග දෙස ආපසු හැරී බලන කල මෙම ප්‍රකාශනය එළි දැක්වීම සඳහා විශේෂ පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද වරප්‍රසාදයක් මෙන් ම භාග්‍යයක් කොට සලකමි.

රට තුල පැවති යුධමය වාතාවරණය අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා සංඥා බලකාය සමස්ථ යුද්ධ හමුදාවේ මෙන්ම මෙරට ජාතික අරමුණු උදෙසා ද තාක්ෂණික දායකත්වය ලබාදීම සඳහා තාක්ෂණයෙන් පිරිපුන් බලකායක් බිහි කිරීමට පුහුණුව ලබාදීමේ අවස්ථාව සලසා දෙමින් කටයුතු කරන බව අභිමානයෙන් යුතුව පෙන්වා දිය හැක.

එහි අඩියරක් වශයෙන් සංඥා ඒකක තුල වෘත්තීය දැනුම, නව තාක්ෂණික දැනුම වර්ධනය කිරීමෙහි අරමුණින් යුතුව සංඥා බලඇණි පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට ආරම්භ කිරීම පසුගිය වසර තුල සිදුවු ක්‍රියාදාම වලින් එකක් බව විශේෂයෙන් සඳහන් කල හැක. මිට අමතරව දේශිය හා විදේශීය ප්‍රභූවරුන් හා යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ලබා දුන් ආරක්ෂක භට පිරිස් සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදීම හා "දියකාවා" ඒකාබද්ධ යුධ අභ්‍යාසය වැනි විශේෂ අවස්ථාවන් වෙනුවෙන් සංඥා සම්බන්ධතාවයන් ලබාදීම මෙම බලසේනා මුලස්ථානයේ අධීක්ෂණය යටතේ සිදුවු බව සඳහන් කරනු කැමැත්තෙමි.

සංඥා රාජකාරීන්ට අමතරව ශ්‍රී ලංකා සංඥා බලකායේ නිලධාරී/සෙසුනිලයින්ගේ ක්‍රීඩා කුසලතාවයන් වැඩිදියුණු කර එය යුද්ධ හමුදාව තුල වර්ණවත් කිරීමට කටයුතු කිරීම තුලින් ඔවුන් ජාතික තලයට ඔසවා තැබීමට පසුගිය කලසීමාව තුල හැකිවු අතර තවදුරටත් එය වර්ධනය කිරීමට සියලු දෙනා කැපවී කටයුතු කලයුතු බව පෙන්වා දෙමි.

තවද මෙම සඟරාවෙහි සාර්ථක එළි දැක්වීම උදෙසා වෙහෙසී ක්‍රියාකල සංස්කාරක මණ්ඩලයටත් මෙම සඟරාව සඳහා නිර්මාණ සපයමින් විවිධාකාරයෙන් දායකවු සියලු දෙනාටත් අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායෙහි නිලධාරීන්ටත් සෙසුනිලයින්ටත් ඔවුන්ගේ පවුල්වල සැමටත් සිවිල් සේවක මහතුන් සහ ඔවුන්ගේ පවුල් වල සැමටත් සෞභාග්‍යය පිරී අනාගතයක් උදෙසා සුභාශිංෂණය පුදකරමි.

එම් ඩී වෛද්‍යරත්න
බ්‍රිගේඩියර්
සංඥා බලසේනාධිපති



## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය

"ද සිග්නලර්" 18 වන කලාපය එළිදක්වන මේ මොහොතේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් තෙවන වරටත් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම ගැන මා ඉතා ආඩම්බර වන අතර, එය මා ලද භාග්‍යයක් කොට සලකමි.

73 වසරක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය, පුරා තිස්වසරක යුද්ධයේදී ලද අත්දැකීම් වලින් පිරිපුන්ව අනාගත අභිවෘද්ධිය උදෙසා නව තාක්ෂණික මංපෙත් ඔස්සේ පෙරමග එළිපෙහෙලි කරමින් ගමන් ගන්නා ඓතිහාසික කාලපරිච්ජේදයක සංඥා බලකා සාමාජික සාමාජිකාවන් හා සමස්ත යුද්ධ හමුදාවම දැනුවත් කිරීම සඳහා මෙවැනි සඟරාවක් අඛණ්ඩව 18 වන වරටත් ඉදිරිපත් කිරීමට හැකිවීම සමස්ත සංඥා බලකායම ලද ජයග්‍රහණයකි.

වෘත්තීය සංඥා සෙබලුන්ගේ සැඟවුනු දක්ෂතා එළි දැකවීමටත්, පසුගිය වසර අග භාගයේ සිට මේ දක්වා සංඥා බලකාය ලබාගත් ජයග්‍රාහී මාවත නිර්මාණශීලීව ඉතාමත් කෙටියෙන් ඔබ වෙත පිරිනැමීමටත් වෙහෙස මහන්සි වූ මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩල සාමාජිකයින්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමි.

අවසාන වශයෙන් මෙම "ද සිග්නලර්" 18 වන කලාපය එළිදැක්වීම සඳහා නව නිර්මාණ, අදහස් හා නොයෙකුත් තොරතුරු ලබා දුන් සංඥා බලකායේ සාමාජික සාමාජිකාවන්ට මාගේ විශේෂ ප්‍රණාමය පිරිනමන අතර, "ද සිග්නලර්" සඟරාව දිනෙන් දින ගුණාත්මක හා කාලෝචිත සඟරාවක් ලෙස ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

එන් පී අකුරන්තිලක
බ්‍රිගේඩියර්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක





## ශ්‍රී ලංකා සංඥා බලකායේ ඈත ඉතිහාසයෙන් මෑත ඉතිහාසයට

1939 වසරෙහි දෙවන ලෝක සංග්‍රාමයත් සමගින් පැනනැගී සන්නද්ධ හමුදා සන්නිවේදන විෂයෙහි අවශ්‍යතාවය උදෙසා සංඥා බලඝණයක් සක්‍රිය සේවය සඳහා කැඳවන ලද අවස්ථාවේ සිට 1958 ඔක්තෝබර් 14 දින 1 වන සංඥා රෙජිමේන්තුව ආරම්භ කිරීම දක්වාත් ඉන් අනතුරුව 2010 වසරෙහි 11 වන සංඥා රෙජිමේන්තුව ආරම්භ කරන තෙක් සංඥා බලකායෙහි ප්‍රගතිශීලී ව්‍යාප්තිය පිළිබඳවත් වන තොරතුරු රැසක් ඉතිහාසයට එක්වූ තොරතුරු ලෙසින් පසුගිය කලාප 17 ක් මගින් විටින් විට ඉදිරිපත් කොට ඇත. ශ්‍රී ලංකා සංඥා බලකාය ආරම්භයේ සිට මේ දක්වා කාලය තුල ප්‍රථම බලකාධිපති වශයෙන් මේජර් ජෙනරාල් CJ අබේරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් කටයුතු කොට ඇති අතර වර්ථමාන බලකාධිපති හා ප්‍රධාන සංඥා නිලධාරී තනතුර මේජර් ජෙනරාල් KRP රොවෙල් RWP USP ndu psc ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් හොබවමින් සිටී. මේ වන තෙක් ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති තනතුර හෙබවූ ජ්‍යෙෂ්ඨ නිලධාරී නාමලේඛනය මෙසේය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | කර්නල් සීජේ අබේරත්න | (15.04.1988 | සිට | 15.07.1988 | දක්වා) |
| 02. | බ්‍රිගේඩියර් සීජේ අබේරත්න | (05.07.1988 | සිට | 01.12.1992 | දක්වා) |
| 03. | බ්‍රිගේඩියර් කේඑ ඥාණවීර | (01.12.1992 | සිට | 22.10.1993 | දක්වා) |
| 04. | කර්නල් එඑම්සීඩබ්ලිව් සෙනවිරත්න පීඑස්සී | (22.10.1993 | සිට | 01.12.1993 | දක්වා) |
| 05. | බ්‍රිගේඩියර් එඑම්සීඩබ්ලිව් සෙනවිරත්න පීඑස්සී | (01.12.1993 | සිට | 01.01.1996 | දක්වා) |
| 06. | බ්‍රිගේඩියර් එච්පීඑන් පද්මසිරි | (01.01.1996 | සිට | 30.04.1997 | දක්වා) |
| 07. | බ්‍රිගේඩියර් එඑම්සීඩබ්ලිව් සෙනවිරත්න පීඑස්සී | (20.01.1997 | සිට | 22.02.1998 | දක්වා) |
| 08. | මේජර් ජෙනරාල් එඑම්සීඩබ්ලිව් සෙනවිරත්න යූඑස්පී පීඑස්සී | (22.02.1998 | සිට | 23.08.2000 | දක්වා) |
| 09. | බ්‍රිගේඩියර් කේජේඑන් සේනවීර ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී | (23.08.2000 | සිට | 20.07.2001 | දක්වා) |
| 10. | මේජර් ජෙනරාල් එඑමසීඩබ්ලිව් සෙනවිරත්න යූඑසිපී එන්ඩියූ පීඑස්සී | (20.07.2001 | සිට | 22.12.2003 | දක්වා) |
| 11. | බ්‍රිගේඩියර් වයිඑස්එ ද සිල්වා යූඑස්පී පීඑස්සී | (22.12.2003 | සිට | 14.05.2004 | දක්වා) |
| 12. | මේජර් ජෙනරාල් එඑම්සීඩබ්ලිව් සෙනවිරත්න යූඑස්පී එන්ඩියූ පීඑස්සී | (14.05.2004 | සිට | 09.08.2004 | දක්වා) |
| 13. | බ්‍රිගේඩියර් වයිඑස්එ ද සිල්වා යූඑස්පී පීඑස්සී | (19.08.2004 | සිට | 29.11.2005 | දක්වා) |
| 14. | මේජර් ජෙනරාල් වයිඑස්එ ද සිල්වා යූඑස්පී පීඑස්සී | (29.11.2005 | සිට | 16.01.2008 | දක්වා) |
| 15. | බ්‍රිගේඩියර් ටිඑෆ් මිඩින් ආර්එස්පී එල්ඩීඑම්සී | (16.01.2008 | සිට | 16.07.2009 | දක්වා) |
| 16. | බ්‍රිගේඩියර් ඊපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී | (16.07.2009 | සිට | 25.05.2010 | දක්වා) |
| 17. | මේජර් ජෙනරාල් ඊපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී | (25.05.2010 | සිට | 08.05.2014 | දක්වා) |
| 18 | මේජර් ජෙනරාල් එස්එපීපී සමරසිංහ ආර්එස්පී යූඑස්පී පීඑස්සී | (22.05.2014 | සිට | 06.05.2015 | දක්වා) |
| 19. | මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී | (07.05.2015 | සිට | | මේ දක්වා) |

ශ්‍රී ලංකාවෙහි සංඥා බලකා මෙතෙක් ඉතිහාසය කාලානුක්‍රමික සංසිද්ධීන් අනුව සමාජ සම්මත දීර්ඝ කාල කඩයිම් මිනුම් ක්‍රම වේදයන් වැඩි වශයෙන් ආභාෂයට ගනිමින් ඈත ඉතිහාසය හා මෑත ඉතිහාසය ලෙසින් යුගයන් දෙකකට ඇතුලත්ව කතිකා කළ හැකිය. ඒ අනුව 20 වන ශත වර්ෂයේ අවසානය තෙක් ඈත ඉතිහාසය ලෙසද වසර 2000 ද ඇතුලත්ව 21 වන ශත වර්ෂය ආරම්භයේ සිට ඉදිරියට මෑත ඉතිහාසය ලෙසද සියලුම සංසිද්ධීන් ඉතිහාස ගත වේ. කඩයිම් වසරක් සේ සැළකෙන 2000 වසරට පෙර ඉතිහාසය මේ වන විට අවශ්‍ය තරම් ලේඛණ ගත වී ඇති බැවින් අනාගත 22 වන ශත වර්ෂයෙහි ශ්‍රී ලංකා සංඥා බලකාය වෙත වර්තමාන 21 වන ශත වර්ෂයේ තොරතුරු නිවැරදි ඉතිහාසය ලෙසින් දායාද කළ යුතුව ඇති බැවින් වසර 2000 න් මෙපිට ඉතිහාසය සංක්ෂිප්තව හා කාලනුක්‍රමිකව සටහන් කිරීම පහත සඳහන් පරිදි ආරම්භ කෙරේ.

### 1. 2000.08.13 - සංඥා මූලික වැඩපල ආරම්භ වීම ( SBW-)

සංඥා මූලික වැඩපල, 1 වන සංඥා රෙජිමේන්තුව යටතේ 1964 දක්වා පැවතින. පසුව එය 2 වන බලඝණ කණ්ඩයන් ලෙස වෙන් වී ක්‍රියාකරන ලදි. එය M කණ්ඩය ලෙස නම් කෙරිනි. පසුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයට සහ සංඥා රෙජිමේන්තුවේ කාර්යය භාර්ය සඵල කර ගැනීම උදෙසා 2000.08.13 දින දී සංඥා මූලික වැඩපල ලෙසින් බිහිවිය. මෙහි ප්‍රථම අණදෙණ නිලධාරී ලෙස මේජර් JN වික්‍රමාරච්චි ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරන ලදි.



The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

### 2. 2003.10.14 - තොරතුරු තාක්ෂණ ඒකකය බිහිවීම (ITU)

1991.08.23 දින දි විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය බිහිවීමත් සමග සංඥා බලකායට විද්‍යුත් දත්ත සැකසුම් ක්ෂේත්‍රයේ නව මං පෙත් විවර කිරීමට හැකි විය. නමුත් 2003.10.14 වන දින දී එම විද්‍යුත් දත්ත සැකසුම් ඒකක නාමය වෙනස් කරමින් තොරතුරු තාක්ෂණ ඒකකය (ITU) ලෙස ප්‍රතිසංවිධානය කරන ලදි.

### 3. 2007.03.12 - ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය බිහිවීම ( HQ CSO )

2007.03.12 වන දින යුද්ධ හමුදා නියෝග 44/2007 යටතේ ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය බිහිවිය. ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය බිහිවීමට ප්‍රථම සිට ප්‍රධාන සංඥා නිලධාරී තනතුර පැවති අතර ප්‍රථම ප්‍රධාන සංඥා නිලධාරී ලෙස බ්‍රිගේඩියර් CJ අබේරත්න ජ්‍යෙෂ්ඨ නිලධාරී සැලකේ. පසුව ඉහත සඳහන් දින සංඥා නිලධාරී මුලස්ථානය ස්ථාපිත කරන අවස්ථාවෙහි බ්‍රිගේඩියර් TF මිඩින් විසින් ප්‍රධාන සංඥා නිලධාරී ලෙස කටයුතු කර ඇති අතර, වත්මන් ප්‍රධාන සංඥා නිලධාරී ලෙස මේජර් ජෙනරාල් KRP රොවෙල් RWP USP ndu psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් කටයුතු කරනු ලබයි.

### 4. 2008.02.08 - 7 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) බිහිවීම.

යුධමය අවශ්‍යතාවයන් මත ශ්‍රී ලංකා සංඥා බලකාය සංඥා රාජකාරී වලට අමතරව පාබල රාජකාරී සඳහා ද යොදවන ලදි. එහි දී පාබල රාජකාරී සඳහා බිහිවුණු 7 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) මේජර් DBC ජයසිංහ psc ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමාගේ අණදීම යටතේ පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී ආරම්භ කරන්නට යෙදිනි.

### 5. 2008.03.26 - 8 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) ආරම්භ වීම.

උතුරු නැගෙනහිර පැවති යුධමය වාතාවරණය තුල යුද්ධ හමුදාවට පාබල රාජකාරී සිදුකර ගැනීම සඳහා හඩ පිරිස් ලබා ගැනීම උදෙසා මෙම 8 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) බිහිවිය. 2008.03.26 වන සිට යුද්ධ හමුදා RO/11/2008.G/SD/S1 ගත ආඥා කෙටුම්පතට අනුව 8 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) පනාගොඩ දී බිහිවිය. මෙහි ආරම්භක අණදෙන නිලධාරී ලෙස මේජර් WACN වරකාගොඩ psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමා කටයුතු කරන ලදී.

### 6. 2008.07.15 වන දින - 9 වන සංඥා රෙජිමේන්තුව ආරම්භ වීම.

මානුෂීය මෙහෙයුම් වෙනුවෙන් සක්‍රිය සංඥා සම්බන්ධතා ලබා දී සෙබලුන්ගේ චිත්ත ධෛර්යය හා ඵලදායි සංඥා සම්බන්ධතාවන් ලබාදීම උදෙසා 2008.07.15 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී 9 වන සංඥා රෙජිමේන්තුව බිහිවිය. මෙහි ආරම්භක අණදෙන නිලධාරී ලෙස මේජර් DMPP දසනායක ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමා කටයුතු කරන ලදී.

### 7. 2008.08.01 - 10 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) ආරම්භ වීම.

මානුෂීය මෙහෙයුම් සඳහා තෙවන ආධාරක බලඇණිය ලෙස 10 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) බිහිවිය. මෙය මුලික වශයෙන් වන්නි මානුෂීය මෙහෙයුම සඳහා සක්‍රියව පාබල රාජකාරීන්හි නිරත විය. මෙහි ආරම්භක අණදෙන නිලධාරී ලෙස මේජර් V L K ජයරත්න psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමා කටයුතු කල අතර එය 2008.08.01 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී ආරම්භ කරන ලදී.

### 8. 2008.08.11 - සංඥා බලසේනා මූලස්ථානය ප්‍රධාන සංඥා නිලධාරී යටතට ගැනීම.

1988.04.04 දින ආරම්භ කරන ලද සංඥා බලසේනා මුස්ථානයෙහි ප්‍රථම බලසේනාධිපති ලෙස කර්නල් CJ අබේරත්න ගත ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමා කටයුතු කොට තිබේ. 2008.08.11 වන ප්‍රධාන සංඥා නිලධාරී මුලස්ථානය යටතේ පනාගොඩ සංඥා බලකා පරිශ්‍රය තුල සංඥා බලසේනා මුලස්ථානය ප්‍රතිස්ථාපනය කරන ලදී.

### 9. 2010.03.01 - තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය බිහිවීම.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තාක්ෂණික දියුණුවත් සමගම යුද්ධ හමුදාවට තොරතුරු තාක්ෂණය සම්බන්ධ සියලුම කටයුතු සිදුකර ගැනීම හා පාලනය කිරීම උදෙසා 2010.03.01 දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ දී තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය බිහිවිය. මෙය ප්‍රධාන සංඥා නිලධාරී යටතේ ස්ථාපනය කරන ලදී. මෙහි වත්මන් අධ්‍යක්ෂක ලෙසින් බ්‍රිගේඩියර් KMRP කරුණාතිලක psc ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමා කටයුතු සිදු කරමින් සිටී.



2016 සීගිරියේ පැවති යොවුන් පුරේ සංදර්ශන පෙර පුහුණු වීම් අතරතුර

සෙ/286128 සංසෙ(කා) බන්ඩාර ජේඑම්එල්කේ හා සංඥා බලකා සෙබලුන්





සෙ/278680 කෝප්‍රල් බන්ඩාරනායක එන්ඒ හා
සෙ/277134 කෝප්‍රල් අනුර වසන්ත බීඩී
සෙ/285700 සංසෙ(කා)රන්දි වීඩී
සෙ/286122 සංසෙ(කා) විජේරත්න
සෙ/286103 සංසෙ(කා) වරකාපොල
සෙ/286128 සංසෙ(කා) බන්ඩාර ජේඑම්එල්කේ
යන පිරික්සුම් පහන් සංදර්ශන සදහා සහභාගී වු සංඥා සෙබළියන් හා ඔවුන්ගේ පුහුණු කරුවන්

සෙ/278680 කෝප්‍රල් බන්ඩාරනායක එන්ඒ හා
සෙ/277134 කෝප්‍රල් අනුර වසන්ත බීඩී හා
සෙ/285700 සංසෙ(කා)රන්දි වීඩී යන පිරික්සුම් පහන් සංදර්ශන සදහා සහභාගී වු සංඥා සෙබළිය හා ඇයගේ පුහුණු කරුවන්



සැකසුම
මේජර් ඩීඑම්එස් දිසානායක පීඑස්සී ශ්‍රීලංසංබ



# UNRECORDED SEGMENT OF CHALLENGES
## (Straight the Horse's Mouth)



Major General CJ Abayaratna VSV USP (Retd) was born on 27 June 1938, He received his Primary Education at Mahamaya College, Kandy, Secondary Education at Trinity College, Kandy (1948 to 1957) and Higher Education at the then University of Ceylon (Science Faculty) in Colombo.

He joined the then Ceylon Army on 10 May 1963 and was commissioned in the rank of Second Lieutenant with effect the same date. He followed the Young Officers Course No 6 at the ATC Diyatalawa at the end of which he was posted to the then Ceylon Signal Corps in December 1963.

He received following military training overseas, (a) Signal Officer Qualifying Course at the School of Signals, Catterick, UK (b). Senior Electronics and Staff Officer Course (SESOC) at the School of Artillery, Fort Sill, Oklahoma USA (c) Senior Officer Technical Course at the School of Signals, Rawalpindi, Pakistan. (c). Pacific Area Senior Officer Logistics Seminar at Cairns, Queensland Australia.

During his illustrious military career Maj Gen Abayaratna held many senior appointments which included CO 1st Sigs Regt SLSC, Commander, Northern Command, Jaffna,. Dy Comd (Admin) SF HQ(J), Commander Central Command, Kandy, Colonel GS, AHQ, Director Training AHQ, Comd Sigs Brigade / CSO, Comd 23 Brigade, Wanni, Comd SF (VNA), Comd, 33 Brigade, Diyatalawa, MS AHQ. In 1992 he was promoted to the rank of Major General and appointed Commander Sri Lanka Army Volunteer Force and later GOC, 1 Div.

Major General Abayaratna is the first ever General of the Signal Corps and also the first Colonel Commandant of the Signal Corps. He is also the first officer of the Signal Corps to be given a Field Command. After an unblemished military career spanning 30 years he retired from service on reaching the mandatory retirement age of 55 years on 27 June 1993. He then joined the Mercantile Sector as an Executive Director of a firm of Management Consultants and worked for 15 years. He now lives in retirement at his ancestral home in Lewella Kandy.

The following narration is an extract from a discussion Col Sugath Ratnayake, Commandant School of Signals had with Maj Gen Abayaratna. It sheds some light on the cherished memories of the Septuagenarian senior officer of yester years in the military field.

" In 1962,there was an attempted Coup by a section of the military in collusion with the disgruntled top brass of the Police Force. The IGP at the time was a civilian in uniform who was totaling ignorant of the goings on in the Police Force. The coup was master minded by a top Civil Servant. The coup failed because some persons loyal to the Govt leaked information.

At that point of time we had 2 Signal Units, a regular unit commanded by Lt Col DV Brohier and a Volunteer unit commanded by Lt Col Basil Jesudason, who was subsequently arrested in connection with the attempted coup. There after the volunteer unit was disbanded along with several other units. The officers and men were absorbed into the 2nd Bn Ceylon National Guard (CNG). All this happened 1 year before I joined the Army.

Soon afterwards Lt Col DV Brohier decided to retire. I do not know whether he went on his own or whether he was asked to retire consequent to the attempted coup. The next in line was Major MJFR Perera, a kindly old man who was approaching retirement age. He was a veteran of WW 2. It is rumored that he declined to take command of the unit

The SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2016

thus paving the way for a parachutist to land. The opportunity was grabbed by Maj CT Caldera of the CLI. He changed his cap badge and joined Signals to be promoted to the rank of Lt Col and appointed as CO. I joined the Regt soon after. He was an efficient administrator but lacked an understanding of the technical work involved. Rightly or wrongly he did not trust his senior officers and never appointed a 2i/c. Further he was never able to integrate with the officer cadre or the ORs. With the change of Govt in 1965, Lt Col Caldera was removed from command and posted as OC Troops Mannar. The post of CO fell vacant once more paving the way for another para landing. The most senior Signal Officer at the time was Maj LJI Fernando but he was considered too junior to be given command, but I believe there were other intrigues and strategies at work behind the scene. This was amply demonstrated when CO 4th Regt CA, Lt Col CF Fernando was appointed CO Signals for his 2i/c to become CO 4th Regt CA.

